VIDUS 18-1/2-E

කතුවැකිය

නව තාක්ෂණය අනුව ඉදිරියට යන පුස්තකාල

මිනැම රටක, සැම ජන කොටසකටම නිහඬව මහඟු සේවයක් සලසන පුස්තකාලවලට ඇත්තේ ඇතට විහිදී ගිය ඉතිහාසයකි. ශ්‍රී ලංකාව ගැන සලකන විට ක්‍රි.පූ. 1 වන සියවසේ දී පමණ මාතලේ අළුවිහාරයේදී වට්ටගාමිණි අභය රජ සමයේදී තේරවාදී බෞද්ධ ත්‍රිපිටකය ලියා පලකිරීමෙන් පසුව පුස්තකාලවල උපත සිදුවූවා යයි සිතිය හැක. එහෙත් එම සිදුවීම දක්වා සියළුම දැනුම් සම්භාරයන් නොනැසී පැවත ආවේ මුඛ පරම්පරාගතවය. ශාස්ත්‍රීය ග්‍රන්ථකරණයේ ආරම්භයත් සමග මිනිසාගේ කියවීමේ රුචියද දියුණු විය. කියවීමට රුචියක් නැත්තවුන් යමෙකුගෙන් අසා දැනගැනීමට රුචියක් දැක්විය. මෙම ක්‍රම දෙකින්ම ලද මහඟු ප්‍රතිඵලය වූයේ ශාස්ත්‍රීය ග්‍රන්ථකරණය හා පුස්තකාලවල සංවර්ධනය එකවිට සුදුවීමය.

පුස්තකාලයක්, පොත්පත්, සහරා ලිපිලේඛන පුවත්පත් ගබඩා කර තබන ස්ථානයක් ලෙසටද හැඳින්විය හැකිය. අප පුස්තකාලයට "ලයිබ්‍රරි" යයි කියමු. ලයිබර් (Liber) යන්නෙහි අරුත පොත යන්නයි. "පොත් ඇති තැන" යන අරුත ඇතිව "ලයිබ්‍රරි" යනුවෙන් පුස්තකාල හඳුන්වයි.

එහෙත් පොත් නැති පුස්තකාලද ඇත. ඒ අනුව ගුවන් විදුලියේ ඇත්තේ රෙකෝඩ් ලයිබ්‍රරියයි. මෙය තැටි ගබඩාව යනුවෙන්ද හඳුන්වයි. රූපවාහිනියේ ඇත්තේ වීඩියෝ ලයිබ්‍රරියයි. පුවත්පත් කාර්යාලයක ඇති පුස්තකාලයක පොත්පත් වලට අමතරව සියළුම පුවත්පත්, හා ඒවායේ ලිපි ලේඛන, ඒ ඒ ප්‍රවෘත්තිවලට සම්බන්ධ පුද්ගලයින්ගේ ජායාරූප, සේයා තහඩු, හා ඔවුන්ගේ ජීවන තොරතුරුද ඇතුලත් වෙයි. කිසියම් සිදුවීමකින් පසු සුළු කාලයක් තුළ එම සිදුවීමට සම්බන්ධ පුද්ගලයින්, රටවල්, සංවිධාන වැනි දේ පමණක්ම නොව ජායාරූප පවා ලබාදීමට පුවත්පත් කාර්යාලයක පුස්තකාලයක් සමත් වෙයි.

පරිගණක තාක්ෂණය, වත්දිනා පණිවුඩ හුවමාරුව මෙන්ම දුරකථනයේ බිහිවීමද පුස්තකාල වල සංවර්ධනයට මහත් පිටුවහලක් විය. මේවාට අමතරව පරිගණකයෙන් කෙරෙන ඉලෙක්ට්‍රොනික, තැපැල හා අන්තර් ජාලය මගින්ද පුස්තකාල වලට සලසන සේවාවද අගනේය.

පරිගණක තාක්ෂණය පුස්තකාලවලට පිවිසීම නිසා පුස්තකාල ප්‍රමාණයෙන් කුඩාවූ අතර එහි අඩංගුවී ඇති තොරතුරු ප්‍රමාණය සාමාන්‍ය පුස්තකාල දහස් ගණනක ඇති තොරතුරු ප්‍රමාණයට වඩා විශාල විය. මේ නිසා යම් අයෙකුට පොතක පිටු පෙරළා තොරතුරු ලබා ගැනීමට ගතවන කාලය අඩුවී ඇති අතර තොරතුරු ලබා දෙන වේගයත්, ලැබෙන තොරතුරු ප්‍රමාණයත් වැඩිවී ඇත.

නව විද්‍යා හා තාක්ෂණික දියුණුව නිසා දැනුමෙන් පොහොසත් වන පුස්තකාල දිනෙන් දින මොහොතින් මොහොත වියපත් වුවත්, එය කාලයට ඔබින තරුණ බවක් ලබමින් ඉදිරියට යයි. එහෙත් නව විද්‍යා තාක්ෂණයට අනුව තොරතුරු සෙවීමට නැඹුරුවන මිනිසා පොතක හෝ පුවත් පතක පිටු පෙරලා කියවීම අතහැර පරිගණක තිරයේ කියවීමට හුරුවීම මහුගේ චින්තනය අඩාල කරවන්නක් වෙයිද? එසේ වීමට වඩාත් ඉඩකඩ ඇත්තේ ස්වාභාවික පරිසරයක් තුළ නිදහසේ පොතක පිටු පෙරලා කියවීමෙන් ලබන දැනුමත් සමග ලබන මානසික සුවය පරිගණක තිරයේ කියවීමෙන් ලද නොහැකි බැවිනි.

වත්මනෙහි විද්‍යා හා තාක්ෂණික තොරතුරු ප්‍රචාරණයේදී පුස්තකාලවලින් සැලසෙන නව සේවාවන් සිට එද පැවති පුස්තකාලවල විකාශනය පිළිබඳ තොරතුරු පාඨකයන් වෙත ලබාදීමේ අරමුණින් තරේසා ආයතනයේ විද්‍යා අධ්‍යාපන කමිටුව "පුස්තකාලය එද සහ අද" යන තේමාව යටතේ මෙවර ප්‍රකාශනය පල කිරීමට තීරණය කළේ මෙහි ඇති කාලීන වැදගත්කම තේරුම් ගෙනය.

සංස්කාරක

VIDUS 18-1/2-3

පුස්තකාලය
එදා සහ අද

ඊශ්වරී කොරයා

එදා පුස්තකාලය

ඉකුත් වසර සියයක පමණ කාලය තුළ පුස්තකාලයන්ගේ වර්ධනය ඉතා සීඝ්‍රයෙන් සිදුවී ඇත. සම්භාව්‍ය සහ මධ්‍යතන යුගයන්හිදී උගැන්ම ප්‍රධාන වශයෙන්ම සිදු වූයේ වාචිකවය. ඉගෙනීම කෙරුනේ වැඩි වශයෙන්ම පන්සල් සහ ආරාම වලය. පැවිද්දන්ද, ගිහි ලේඛකයින්ද ආරාම ආශ්‍රිත පුස්තකාලයනට සම්බන්ධව සිටි බව පෙර අපර දෙදිගම ඓතිහාසික ප්‍රවාදයන්ගෙන් පෙනී යයි. එහෙත් තවදුරටත් අතීත වාර්තා සජීවීව පවත්වා ගෙන යාමේ සාමාන්‍ය ක්‍රමය වූයේ කථාන්තර සහ කවි කතා වාචිකව නැවත නැවත කීමයි. ක්‍රි.පූ. 1 වන සියවසේදී, ශ්‍රී ලංකාවේ අළුවිහාරයේදී වට්ටගාමිණී අභය රජු සමයේදී ලේඛන ගත කරන ලද ථෙරවාදී බෞද්ධ ත්‍රිපිටකය ඒ දක්වා ආරක්ෂා වූයේ මුඛ පරම්පරාවෙනි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මයද සැලකිය යුතු කාලයක් ලේඛණගත නොවී පැවතිනි. අතීතයේදී මිනිසාගේ සමස්ථ දැනුම් සම්භාරය අන්තර්ගත වූයේ මුවින් ප්‍රකාශ වූ සම්ප්‍රදායයෙහිය.

ඉපැරණි යුගයේදී පොත්පත් වලට ගෞරව සම්මාන කරන ලද්දේය. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ හඳුන්වනු ලැබුවේ "පොත් වහන්සේ" යන පාඨයෙනි. මේවා වැඩි වශයෙන්ම දක්නට ලැබුණේ පන්සල් වලය. සාමාන්‍ය ගිහියන් අතට මේවා පත් නොවූ අතර, විනෝදයට කියවීම පිණිස පොත්පත් නොතිබිණ. පුරාතණ යුගය මුළුල්ලේම කියවීමේ හැකියාව ඇති පුද්ගලයෙකු විසින් ශ්‍රාවක පිරිසකට පොතක් හඬ නගා කියවන ලදී. ශ්‍රී ලංකාවේ, අනුරාධපුර සහ පොළොන්නරු යුගයට අයත් ග්‍රන්ථ රචනා කර ඇත්තේ ප්‍රධාන වශයෙන්ම හඬනගා කියවීමට උචිත වන පරිදිය. පොත්පත් සැඟෙන සංඛ්‍යාවක් ඇති පුස්තකාල තිබුණද, ජනතාව පුස්තකාල සැලකුයේ "හිරිහැරකාරී සන්නිවේදන මාධ්‍යයක්" වශයෙනි. මෙම ආකල්පය දීර්ඝ කාලයක් තිස්සේ පැවතිණ. එහෙත් වර්තමානයේ මෙම තත්වය මුළුමණින් වෙනස් වී ඇත. මෑතක් වන තෙක් පුස්තකාලයක් යනු උගත්, හැදියාවකින් යුත් පිරිසක් නියෝජනය වූ සංකේතයක් විය. එහෙත් මෙකල සමාජයීය සහ ආර්ථික වෙනස්කම් ඇතිවීමත් සමග, මිනිසුන් වැඩි සංඛ්‍යාවක් පුස්තකාලයක වරප්‍රසාද භුක්ති විඳී.

1 වන සියවසේදී, ශ්‍රී ලංකාවේ අළුවිහාරයේදී වට්ටගාමිණී අභය රජු සමයේදී ලේඛන ගත කරන ලද ථෙරවාදී බෞද්ධ ත්‍රිපිටකය ඒ දක්වා ආරක්ෂා වූයේ මුඛ පරම්පරාවෙනි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මයද සැලකිය යුතු කාලයක් ලේඛණගත නොවී පැවතිනි. අතීතයේදී මිනිසාගේ සමස්ථ දැනුම් සම්භාරය අන්තර්ගත වූයේ මුවින් ප්‍රකාශ වූ සම්ප්‍රදායයෙහිය.

අද පුස්තකාලය

පුස්තකාලය නිශ්චිත ස්ථානයක පිහිටා තිබූ අවධියේ පටන් ලෝක පරිමාණ යුගය දක්වා එය ක්‍රමයෙන් විකාශනය වී ඇත. තොරතුරු විසුරුවා හැරීමෙහිලා නවීන විදුලි සංදේශ ක්‍රම වලින් වැදගත් කාර්යභාරයක් ඉටු වෙයි. මෙකල තොරතුරු කොතරම් විශාල වශයෙන් ජනනය වේද යත්, මුද්‍රිත එමෙන්ම මුද්‍රිත නොවන ප්‍රකාශන වර්ග රාශියක් ඉතා සීඝ්‍රයෙන් නිකුත් වීගෙන යයි. මෙකල පර්යේෂණ සඳහාද, තොරතුරු ඒකරාශි කිරීම සඳහාද ගැණුම්කරුට පාඨකයාට තෝරාගත හැකි මනාව සංවිධානය වූ සුසංහිත තොරතුරු ජාල සහ දත්ත පදනම් ඇත.

පුස්තකාල වර්ග

ඒ ඒ පාඨකයිනට සේවා සළසන පුස්තකාල වර්ග රාශියක් ඇත. එනම් ජාතික, මහජන, පාසැල්, විශ්වවිද්‍යාල සහ විශේෂ යනාදී වශයෙනි. ඒවායින් සැළසෙන සේවා සහ ඒවායේ සම්පත් හා අදල පාඨකයින්ගේ අවශ්‍යතා අතර සෘජු සම්බන්ධයක් පවතියි. පුස්තකාලයක සේවය කරන සෑම කෙනෙක්ම, තම පුස්තකාලයේ නිශ්චිත අරමුණු සහ පරමාර්ථ වටහාගෙන ඒවාට මැනවින් නුරු විය යුතුය.

ජාතික පුස්තකාලය

රටක නිත්‍යානුකූල තැන්පතු පුස්තකාලය වන ජාතික පුස්තකාලය මගින්, රටෙහි සංස්කෘතික හා සාහිත්‍යමය උරුමය සංරක්ෂණය කරනු ලබයි. ජාතික ග්‍රන්ථ නාමාවලිය සහ රටතුල ඇති පුස්තකාලයන්හි ඇති සම්පත් පිළිබඳ ඒකාබද්ධ සුචි ඇතුළු වෙනත් නාමාවලි ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම එයට අයත්වන කාර්යයන්ගෙන් සමහරකි. රජයට සැලසුම් නිෂ්පාදකයන්ට සහ නීති සම්පාදකයින්ට තොරතුරු සැපයීමේ වගකීමද එයට පැවරී ඇත. ජාතිය සතුව ඇති මුද්‍රිත, සහ අත්පිටපත් ඇතුළු මුද්‍රිත නොවන සාහිත්‍ය සමුච්චය එමගින් අත් කරගෙන, සංවිධානය කොට සංරක්ෂණය කර තබනු ලබයි. ජාතිය සතු පුස්තකාල සම්පත් සමාජයේ ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කිරීමද එහි යුතුකම වෙයි. මේ වෘත්තීය ක්ෂේත්‍රයට නායකත්වය සපයනු ලබන්නේ ජාතික පුස්තකාල මගිනි.

මහජන පුස්තකාලය

සෑම ජනකොටසකටම සේවය සළසන මහජන පුස්තකාලය, වෙනත් පුස්තකාලයන් ගෙන් වෙනස් වෙයි. එමගින් පාඨකයිනට අධ්‍යාපනය සහ විනෝදස්වාදය සඳහා පහසුකම් සපයමින් පුළුල්වූත්, පරිපූර්ණවූත් සේවාවක් සළසයි. ස්වෝත්සාහයෙන් අධ්‍යාපනය ලබන්නන්ට අදලවද වැදගත් කාර්යභාරයක් එමගින් ඉටු කරයි. ප්‍රජාවගේ අවිධිමත් අවශ්‍යතා සපුරාලන අතර එමගින් පාඨකයාගේ පෞද්ගලිකත්වය සුපෝෂණයටත් වැඩිදුර වර්ධනයටත් ආධාරක වෙයි.

සියඵම වයස් සීමාවන්ට අයත්, විවිධ පසුබිම් වලට, සංස්කෘතීන්ට, පන්තිවලට සහ අධ්‍යාපනික මට්ටම්වලට අයත් පුද්ගලයින් මේ සා විශාල සංඛ්‍යාවක් සහ පරාසයක් පොදුවේ එකම සේවාවන් හාවිතා කරනු වෙනත් කිසිදු පුස්තකායක දක්නට නොලැබේ. එය සෑම විටම සමාජයේ ප්‍රමුඛස්ථානය දරන්නවුනට මෙන්ම කොන් වුවන්ට සේවය සළසයි. තමන් වෙත අත් අයගේ නෙත් යොමු නොවී හෝ යමක් මිලදී නොගෙන, රැඳී සිටිය හැක. එකම පොදු ස්ථානය එය වන්නේය.

පාසල් පුස්තකාලය

පාසැලෙහි අධ්‍යාපන වැඩ සටහනට අධාර කරමින් ඒ සඳහා අත්‍යාවශ්‍ය සියළු සම්පත් සපයයි. එය ශිෂ්‍යයින් තුළ "අධ්‍යයන හැකියාවන්" සහ "විඥාපණ හැකියාවන්" නංවාලන ස්ථානයක් වෙයි.

විශ්වවිද්‍යාල පුස්තකාලය

විශ්වවිද්‍යාලයේ කාර්යයන් සපුරාලීම සඳහා පුස්තකාලය සිය කටයුතු මෙහෙයවයි. එය උගැන්වීම සහ පර්යේෂණයට අදල සක්‍රීය බලවේගයක් වන අතර, එය විශ්වවිද්‍යාල ව්‍යුහය තුළ ශිෂ්‍යයින්ගේ සහ පීඨයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත්වන සංරචකයක් වෙයි. විශ්වවිද්‍යාලයකට ප්‍රබල පුස්තකාලයක් තිබීම අත්‍යාවශ්‍යය.

විශේෂ පුස්තකාලය

විවිධ ආයතනයන්හි ඇති ප්‍රධානතම තොරතුරු මූලාශ්‍රය එහි පුස්තකාලයයි. මෙහිදී අවධාරණය වනුයේ අදල විෂය ක්ෂේත්‍රයේ පර්යේෂකයින් හෝ විද්‍යාඥයින් වන එහි පාඨකයින් වෙනුවෙන් පොත්පත් එක්රැස් කිරීම සංවිධානය කිරීම සහ තොරතුරු සමුද්ධරණය කිරීම යන කටයුතුය.

සමස්ථයක් වශයෙන් ගත්කල ඕනෑම පුස්තකාලයකට තම ප්‍රජාවගේ අවශ්‍යතාවනට අදලව උසස් තත්වයේ සේවාවක් සැලසීමට හැකියාව තිබිය යුතුය. පාඨකයාට/පරිභෝග කරන්නාට/ගැණුම්කරුට ඔවුන්ගේ පුස්තකාලයට පහසුවෙන් ප්‍රවිෂ්ඨ විය හැකි මිත්‍රශීලී ලෙස සැලකිය හැකිවුන්, තම අභිලාශයන් මුදුන්පත් කර ගත හැකිවුන්, ස්ථානයක් විය යුතුය. උපදෙස් හා සහාය පහසුවෙන් ලබාගත හැකි බැව් පාඨකයාට ස්ථිර වශයෙන් දැනගැනීමට සැලැස්වීම වැදගත් වෙයි. වෘත්තීය මට්ටමේ සේවයක් සැලසීම තාක්ෂණය සඳහා මුදල් ආයෝජනය කිරීමට වඩා දුෂ්කරය. කාර්ය මණ්ඩලය තුළ සේවයට සැබෑ කැපවීමක් තිබිය යුතුය. වත්මන් යුගයේදී පුස්තකාල සේවා අලෙවිකරණය සහ ජනප්‍රිය කරවීම අත්‍යවශ්‍යයෙන් කළ යුතු කාර්ය වෙයි. මෙම ප්‍රචාරක කටයුතු, ලිපි ලේඛන ජන මාධ්‍යය සහ පාඨකයා විසින් හෙළි කළ හැකිය. නවමු සහ නව්‍යතා හඳුන්වාදීමේ ආකල්පයක්ද පිරිවැය අතින් කාර්යක්ෂමව ඉලක්ක කල ක්‍රමෝපායද ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ අවශ්‍යය.

පුස්තකාල පාඨකයින්ගේ අධ්‍යයනය ඔවුන් අවශ්‍ය යයි පවසන දේ මත පමණක් නොව, අනිවාර්යයෙන්ම ඔවුන්ට සැබවින්ම අවශ්‍ය වන දේ මත පදනම් වන බැව් අවබෝධ කරගත යුතුය. වෙනත් වටනවලින් කියතහොත් ප්‍රශ්නාවලි වලට ලැබුනාවූ පිළිතුරු හෝ හමුවීම වටා ගෙතුන ස්ථිතික අධ්‍යයනවලට පමණක් සීමා නොවී සක්‍රීය පාඨකයින්ගේ හැසිරීම් රටාව මත සැකසුන අධ්‍යයනය විය යුතුයි. තොරතුරු ප්‍රතිග්‍රහණය කිරීමේදී ඔවුනට මුහුණපෑමට සිදුවන දුෂ්කරතා හඳුනාගත යුතුය.

අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කවර සම්ක්ෂණ, ප්‍රශ්නාවලි, රැස්වීම් සහ සම්මුඛ පරීක්ෂණ යොද ගත්තද, එම තොරතුරු අරමුණු කරගත් අනුග්‍රාහකයින්ගේ ආකල්ප පිළිබඳව අහම්බෙන් ප්‍රතිග්‍රහණය කර ගන්නා තොරතුරුද ඒ හා සමානවම වැදගත් වනු ඇති බැවි මතක තබා ගැනීම සුදුසුය. මෙහිදී පාඨකයාගේ වැදගත්කම සෑම විටම අධ්‍යක්ෂ/පුස්තකාලයාධිපතිගේ මනසේ ප්‍රමුඛස්ථානයක රැඳිය යුතුය.

පුස්තකාල පාඨකයින්ගේ අධ්‍යයනය . ඔවුන් අවශ්‍ය යයි පවසන දේ මත පමණක් නොව, අනිවාර්යයෙන්ම ඔවුන්ට සැබවින්ම අවශ්‍ය වන දේ මත පදනම් වන බැව් අවබෝධ කරගත යුතුය. වෙනත් වටනවලින් කියතහොත් ප්‍රශ්නාවලි වලට ලැබුනාවූ පිළිතුරු හෝ හමුවීම වටා ගෙතුන ස්ථිතික අධ්‍යයනවලට පමණක් සීමා නොවී සක්‍රීය පාඨකයින්ගේ හැසිරීම් රටාව මත සැකසුන අධ්‍යයනය විය යුතුයි.

පුස්තකාල භාවිත කරන්නවුන් පුස්තකාල සුවි පිරික්සීමට හෝ, පුස්තකාල කාර්ය මණ්ඩලය සමග තමන්ට වැදගත් කරුණු සාකච්ඡා කිරීමට හෝ තම දුෂ්කරතා සාකච්ඡා කිරීමට මැලිවීම ඉතා කණගාටුදයක තත්වයකි. මා විශ්වාස කරන අන්දමට තවමත් පවතින මෙම මැලිකම හරලිය යුතුය. සහාය පැතීම සහ සහාය ලැබීම සාමාන්‍ය සමාජයීය ක්‍රියාවක් වන අතර, ඒ බැව් පිළිගතයුතු වන්නේය. පුස්තකාල භාවිතා කරන්නවුන් සහ කාර්ය මණ්ඩලය අතර සාකච්ඡා ඇතිවිය යුතුය. සෙවිය යුතු තොරතුරු පිළිබඳව ප්‍රශ්න ඇසීම සඳහා සුදුසු වාතාවරණයක් ඇති වන පරිදි මෙම සාකච්ඡා හැකිතාක් නොවිධිමත් ස්වරූපයක් ගත යුතුය.

නවීන පුස්තකාලයක්, බාහිර ලෝකයේ සිදුවන සීඝ්‍ර වෙනස්වීම තුළින් ඇතිවන ආතතීන් අපහසුවකින් තොරව දරා ගැනීමට ප්‍රමාණවත් නව්‍යතාවයකින් යුක්ත විය යුතුය. දැන් අවධාරණය විය යුත්තේ විද්‍යුත් තොරතුරු මූලාශ්‍රයනට සහ විද්‍යුත් තොරතුරු ජාලයනට ප්‍රවිශ්ඨවීම යන කරුණුය. එබඳු පද්ධති භාවිතය, පාඨකයින්ට හඳුන්වා දිය යුතුය. තොරතුරු තාක්ෂණය පාඨකයිනට ඉදිරිපත් කර ඔවුන් තුළ තාක්ෂණික උගැන්ම ඇති කිරීමට දැන් කාලය එළඹ තිබේ. ඔවුනට තම පුස්තකාලයේ හෝ ඉන් බැහැර වෙනත් පුස්තකාලයක, නගරයක හෝ රටක ඇති තොරතුරු සොයා ගැනීමේ හැකියාව තිබිය යුතුය. ඒ සඳහා ළමයින්ට, තරුණ තරුණියනට සහ පර්යේෂකයිනට පවා මග පෙන්වීම අවශ්‍යය. තාක්ෂණ විද්‍යා ලොවෙහි තෙරතුරු පද්ධති ඉතා සීඝ්‍රයෙන් ඉදිරියට යන බැවින් තොරතුරු අධ්‍යක්ෂ හෝ පුස්තකාලයාධිපතිවද, ඉලෙක්ට්‍රොනික තැපැල් දත්ත පදනම් (E Mail Data Base) මාර්ගගත පද්ධති : යනාදිය භාවිතය පිළිබඳ පුහුණුවක් අවශ්‍ය වෙයි.

පුස්තකාලයන්හි අන්තර්ජාල වැනි ජාත්‍යන්තර පද්ධතින්ට ප්‍රවිශ්ඨවීමේ පහසුකම් තිබීම ලෝකයේ ඕනෑම තැනක, ඕනෑම විෂයයක් පිළිබඳව ප්‍රවර්තන තොරතුරු සීඝ්‍රයෙන්

ලබා ගැනීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. මේ ආකාරයට කිසිවෙකුත් ලෝකයෙන් වෙන්ව නුදකලාවීම අවශ්‍ය නොවන්නේය. පුස්තකාල හාවිතා කරන්නවුනට, නවතම ප්‍රකාශන සහ ලිපි යනාදිය ලබාගත හැකිවන අතර, මනාව දැනුවත් වීමේ හැකියාව ලැබෙයි. මෙම ප්‍රවිෂ්ඨවීමේ දැනුම් සම්හාරය ලබා ගැනීමට හැකියාව තිබීම ඇත්තෙන්ම ඉතා අගතේය. වත්මන් යෞවන මෙම දැනුම් සම්හාරය ලබා ගැනීමේ හැකියාව ඇත්නම් ඔවුන් සැබවින්ම වඩාත් හොඳින් අනාගතයට මුහුණදීමට හැකි තත්ත්වයකට එනු ඇත. මෙසේ වීමෙන් ප්‍රීතිමත් එමෙන්ම සෑහීමට පත්වූ ජාතියක් බිහිවනු ඇත. මේ සියල්ල සාර්ථකවීමට නම් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උද්යෝගය තිබිය යුතුය. තොරතුරු සමස්ථ වශයෙන් ඵලදායී වීමට නම්, තම සේවය ලබන්නවුන් කෙරෙහි කාර්ය මණ්ඩලයේ මිත්‍රශීලී බව සහ ඔවුනට පහසුවෙන් සම්පවීමේ හැකියාව තිබීම අත්‍යවශ්‍ය වන්නේය. තොරතුරු සුපිරි මාවත ප්‍රබල ලෙස මුල් බැසගතහොත් පොත්පත් සහ මුද්‍රිත මාධ්‍ය අහෝසිවී යාමට ඉඩ ඇත්තේය.



පොත්පත් කියවීම දැනුමත්
විනෝදස්වාදයත් ලබා දෙන්නකි

VIDUS 18-1/2,7

පුස්තකාල භාවිතය පරමාදර්ශයන් සහ යථාර්තයන්

එන්.ටී.එස්.ජී. සේනාධීර
පුස්තකාලයාධිපති
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

සාරාංශය : ප්‍රශස්ත ගණයේ පුස්තකාලයක් පිහිටුවීමෙන්ම, එහි සම්පත් සහ සේවාවන් පූර්ණ වශයෙන් උපයෝජනය කරගැන්ම සිදු නොවේ. පුස්තකාලයකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, තොරතුරු ගවේශකයින් විසින් තොරතුරු ගවේෂණය කිරීමේ නියි ක්‍රියා මාර්ග අවබෝධ කරගෙන ඒවා ක්‍රියාවට තැංවිය යුතු වෙයි. පුස්තකාල පාඨකයින් බොහෝ දෙනෙක් එබඳු හැකියාවන් වර්ධනය කර ගැනීමේලා දක්වා ඇත්තේ මද උනන්දුවකි. පාඨක අධ්‍යාපනය සඳහා දැනට විධිමත් විධිවිධාන යොද ඇත්තේ පුස්තකාල කිහිපයක පමණකි. වර්තමානයෙහි පාඨක අධ්‍යාපනය දැනට හුදෙක් පුස්තකාල සතු වගකීමක් වශයෙන් සලකන තමුදු, එබඳු වැඩ සටහන්වල සාර්ථකත්වය, පුස්තකාලවල පාලනයෙන් පරිබාහිර වූ වැදගත් සාධක රාශියක් මත රඳ පවතියි.

1. පරමාදර්ශී පුස්තකාලය

ලිපි ලේඛන එක්රැස් කිරීම, සංරක්ෂණය සහ ප්‍රයෝජනය සඳහා කැපවුනු ආයතන වශයෙන් පුස්තකාල හැඳින්විය හැකිය. තවද, පුස්තකාල යනු බුද්ධිමය, හැකියාවන්, පර්යේෂණ අධ්‍යාපන, තොරතුරු විවේකාස්වාද සහ ජන සමාජයේ වෙනත් බොහෝ සමාජීය හෝ සංස්කෘතික අවශ්‍යතාවන් ඉටුකරන්නාවූ නූතන ශිෂ්ඨාචාරයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙසද පුස්තකාල සලකනු ලැබේ.

අවශ්‍ය ගුණාංගයන්ගෙන් යුත් පුද්ගලයාට පුස්තකාලය යනු නිරන්තරයෙන් පුදුමය දනවන්නාවුත්, අලුත් දැනුම අත්කර දෙන්නාවුත්, මනුගේ වර්ධනයට හේතු වන්නාවුත්, ස්ථානයක් වෙයි. ශාස්ත්‍රඥයාට සහ විද්‍යාඥයාට, පුස්තකාලය තමන්ගේ උනන්දුව යොමුවන විෂයට අදල තොරතුරු කියවීම සඳහා ඉතාමත් යෝග්‍යවූ පරිසරයක් සලසයි.

2. පරමාදර්ශය සහ යථාර්තය අතර වෙනස

පුස්තකාලයක කාර්යභාරය, දිරිගන්වන සුළු වදනින් ඉහත විස්තර කළ පරිද්දෙන් සරලව පිළිගැනීමෙන්, ඇතැම් විට එකී අරමුණු අසාර්ථක වීමටත් නිෂ්ඵල වීමටත් ඉඩ ඇත. දශක පහකට ඉහතදී, බ්‍රිතාන්‍ය

පුස්තකාල හා සම්බන්ධව. මෙම කරුණටම අදලව කානෙල් (Carnel) විසින් මෙසේ පවසා ඇත. "පුස්තකාලය බුද්ධිමය කාර්යස්ථානයක් සහ සංස්කෘතික මධ්‍යස්ථානයක් වීම අගතේය.එහෙත්, ඒ සඳහා වෙහෙස වී වැඩ කළ යුතු වෙයි. එයට මුදල් වැය වෙයි. එමෙන්ම, එයට හිතකර වූ යම් යම් තත්ත්වයන් එක්තැන්වීම අවශ්‍ය වෙයි. එබඳු සාධක අතුරින් ඇතැම් ඒවා පුස්තකාලයාධිපතීන්ට පාලනය කළ නොහැකි ඒවා වෙති".

ස්වයං ඇගයීමක් කිරීමේ ශක්තිය ඇති සියළුම පුස්තකාලයාධිපති වරු, තම තමන්ගේ ආයතනයට අදලව පරමාදර්ශයන් සහ සැබෑ තත්ත්වයන් අතර පරතරය ඇති බව දනිති. සියළුම යහපත් පුස්තකාලයාධිපති වරු, පාඨකයින්ගේ ප්‍රයෝජනය උදෙසා නව පුස්තකාල ද්‍රව්‍ය, ප්‍රතිග්‍රහණය, සුවිකරණය සහ සංවිධානය කිරීමෙන් නවතම දැනුම ලබාදීමට උත්සුක වෙති. එහෙත් එකී විධිමත් කටයුතු ඉටු කිරීමෙන් පමණක්, සලසා ඇති පහසුකම් උපරිම අයුරින් උපයෝගීකරණය වීම සිදු නොවේ.

තොරතුරු ගවේෂකයින් විසින් පුස්තකාල සහ ඒවායේ සම්පත්, ඌණ වශයෙන් උපයෝජනය කර ගැනීමට තුඩු දෙන කරුණු පිරික්සීමට මෙම සරල සමීක්ෂණ තුළින්, ප්‍රයත්නයක් දැරෙනු ඇත.

3. තොරතුරු සෙවීමේ ක්‍රියාවලියට තොරතුරු හාවිතා කරන අයගේ සහභාගිත්වයේ අවශ්‍යතාව

පුස්තකාලයක කාර්යභාරය දිරි ගත්වන සුළු වදනකින් පිළි ගැනීමේදී, ඇතැම් විට, පුස්තකාලයකින් අත්වන ප්‍රතිලාභ ඵහි අනුග්‍රහලාභීන් වෙත නිරායාසයෙන් ලභා වේය යන සාවද්‍ය හැඟීම ඇතිවිය හැක. පුස්තකාලයක් අළුත් කියවන ද්‍රව්‍යයන්ගෙන් පිරී තිබිය හැකිය. එය පහසුකම් හා සේවාවන්ගෙන්ද සමන්විත විය හැකිය. එවැනි පුස්තකාලයකින් ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබිය හැක්කේ, තොරතුරු ගවේෂණය කිරීමේ සහ තොරතුරු හාවිතා කිරීමේ කටයුතු වල පාඨකයින් ක්‍රියාශීලීව නිරත වීමෙනි.

නව ප්‍රතිග්‍රහණ කියවා බැලීම හෝ නව ප්‍රවර්තන සහරා පෙරළා බැලීම, පුස්තකාලයට අළුතින් පැමිණෙන පාඨකයෙකුට ඵලදායී අත්දැකීමක් විය හැකිය. මක් නිසාද යත්, එසේ කිරීමෙන් ඔහු විසින් නව තොරතුරු සොයා ගත්තවා පමණක් නොව, තොරතුරු සොයා ගැනීම සඳහා මෙතෙක් හඳුනානොගත් ක්‍රම ඉගෙන ගැනීමටද ඉඩ ඇති බැවිනි. කියවීමට උනන්දුවකින් යුත් පාඨකයෙකු විසින්, තමන් කියවීමට කැමති යමක් මුලින්ම පුස්තකාල සුවියෙහිද, ඉන්පසු පුස්තකාලයෙහි පොත් රාක්ක වලද සෙවීමට තැත් කිරීමේදී, මෙම හැකියාවන් තවදුරටත් වැඩිදියුණු වීමට ඉඩ ඇත. තමන්ට අවශ්‍ය දෑ රාක්කවල නොමැති වූ විට, පුස්තකාලයේ පාඨක සේවා කාර්ය මණ්ඩලය ඇමතීමට පාඨකයාට මෙය අවස්ථාවක් කරගත හැකිය. එවිට පාඨකයා කුතුහලයෙන් යුක්ත නම්, ඔහුට පුස්තකාල කාර්ය මණ්ඩලය යමක් සොයා ගැනීමට උපයෝගී කරගන්නා ක්‍රම නිරීක්ෂණ කළ හැකිය. උනන්දුවන පාඨකයාට මෙය තම පුස්තකාල අධ්‍යාපන ක්‍රියාවලියේ මූලාරම්භය කරගත හැකිය.

ඇතැම් පාඨකයෝ මෙම අවස්ථාවේ සිට පුස්තකාලයේ තොරතුරු සෙවීම පුස්තකාල කාර්ය මණ්ඩලය සතු වගකීම වශයෙන් සළකති. තොරතුරු සොයා ගැනීමේලා පාඨකයාට සහාය වීම පුස්තකාලයක වගකීම වුවත්, පාඨකයා විසින් පුස්තකාලයක තොරතුරු සෙවීමට අදල මූලික කරුණු ප්‍රගුණ කිරීම ප්‍රයෝජනවත් වනු ඇත.

තම විෂයයට අදල නව ලිපි ලේඛන සොයා ගැනීම සඳහා වාරසඟරා අනුක්‍රමණිකා උපයෝගී කර ගැනීමෙන් පාඨකයා ගේ මෙම ප්‍රායෝගික සහභාගිත්වය, තවදුරටත් දියුණු වනු ඇත. විෂයකට අදල නවතම ලිපි ලේඛන සම්ක්ෂණය කිරීම සඳහා සාර සංග්‍රහ සහරාවක් හාවිතය කිරීම හෝ, CD-ROM දත්ත පදනමක් හාවිතයෙන්, විෂය ගවේෂණයක් කිරීමේ හැකියාව, පාඨකයා විසින් දිගුකාලීනව, ඵලදායී අන්දමින් පුස්තකාලයක් ඇසුරු කිරීමෙන් ප්‍රගුණ කරගතහැකි අනෙකුත් හැකියාවන් අතර වෙයි.

පුස්තකාලයකින් ඒ උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නම්, පාඨකයා ප්‍රායෝගිකව එයට සම්බන්ධවීම සුදුසුවනවා පමණක් නොව, අවශ්‍ය වන බව පැහැදිලිය. පුස්තකාල බලධාරීන් විසින්, පාඨකයින්ගේ තොරතුරු සෙවීමේ හැකියාවන් වර්ධනය කර ගැනීමේලා ආධාර සහ අධ්‍යාපනය ලබාදිය යුතුය. මෙම ව්‍යායාමය තොරතුරු සොයා ගන්නා දක්වන උනන්දුව තුළින්ම ආරම්භ විය යුතුය.

4. පුස්තකාල සම්පත් පරිහරණය අඩුවීම

පුස්තකාල සම්පත් පරිහරණය අඩු මට්ටමකින් සිදුවීම ලොව පුරා දක්නට ලැබෙන්නාවූත්, පුස්තකාලයක උපරිම ප්‍රයෝජන වළක්වන්නාවූත් ප්‍රවණතාවකි. මෙම ප්‍රවණතාව නිසාම, අගනා පුස්තකාල ද්‍රව්‍ය හාවිත නොවීමේ හේතුවෙන්, අගනා මූල්‍යමය සම්පත් අපතේ යාම සිදු වෙයි.

පාඨකයින් තුළ දක්නට ලැබෙන පහත සඳහන් ඇතැම් ලක්ෂණ, මෙම අවාසනාවන්ත තත්ත්වයට ප්‍රධාන හේතු වශයෙන් හඳුනාගෙන ඇත.

1. තම අවශ්‍යතාවන් සපුරාලීමට හැකියාව ඇති නිශ්චිත පුස්තකාලය හෝ පුස්තකාල හඳුනා ගැනීමට පාඨකයාට නොහැකි වීම.

2. තම පුස්තකාලය තුළ පුස්තකාල ද්‍රව්‍ය තැන්පත් කර ඇති ආකාරය පිළිබඳව පාඨකයා තුළ ඇති අල්ප දැනුම.

3. පුස්තකාල සුවිය සහ වෙනත් තොරතුරු මූලාශ්‍ර නිසි ලෙස හාවිත කිරීමට පාඨකයාට හැකියාව නොමැති වීම.

4. තම විෂයට අදාළ වාර සහරා සොයා ගැනීමට ඔහුට හැකියාව නොමැතිවීම.

5. තමාට අදාළ වාර සහරා සුචි සහ සාරසංග්‍රහ සහරා සොයා ගැනීමට ඔහුට නොහැකි වීම.

6. තමන්ගේම පුස්තකාලයෙහි හෝ වෙනත් පුස්තකාලයන්හි ඇති විශේෂ කියවීම් ද්‍රව්‍ය සොයා ගැනීමට ඔහු තුළ උනන්දුවක්වත් නොමැති වීම. (තමන්ට හැකියාවක් නොමැති වීමද හේතුකොටගෙන)

7. තමන්ට අවශ්‍ය කියවීම් ද්‍රව්‍ය හා දත්ත සොයා ගැනීම සඳහා පුස්තකාලයෙහි කාලය ගත කිරීමට ඇති අකමැත්ත

8. කියවීම් ද්‍රව්‍ය ඇති ස්ථාන සහ අපදන දත්ත ඇති තැන් සෙවීම පුස්තකාල කාර්ය මණ්ඩලයේ වගකීම වන බවට ඔහු තුළ ඇති සාවද්‍ය හැඟීම.

9. පාඨක සේවා කාර්ය මණ්ඩලය හා මිත්‍රශීලී සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකි වීම.

10. පුස්තකාල ද්‍රව්‍ය සොයා ගැනීමේ අපහසුතා ඇති විට පුස්තකාල කාර්ය මණ්ඩලයෙන් විමසීමට පාඨකයින් තුළ ඇති අකමැත්ත.

11. තම විමසීම් නිසි පරිදි සකස් කර ඉදිරිපත් පාඨකයින්ට නොහැකි වීම.

12. ඇතැම් පුස්තකාලවල පාඨකයින් දැනුවත් කිරීම සඳහා පහසුකම් සළසා තිබියදී වුවත්, තොරතුරු ගවේෂණ ක්‍රම උගැන්මට තොරතුරු සොයන්නවුන් තුළ උනන්දුවක් නොමැතිවීම.

5. සාහිත්‍ය ගවේෂණයක මූලික පියවර

සියළුම ගවේෂණ ආවරණය වන පරිදි සරල උපදෙස් මාලාවක් සැපයීමට නොහැකි වුවත්, කිසියම් මාතෘකාවක් පිළිබඳව පුද්ගලයෙකුගේ දැනුම වැඩිදියුණු කරලීමට අවශ්‍ය තොරතුරු සමුද්ධරණය සඳහා සැලසුම් කළ හැකි පොදු ස්වරූපයකින් යුත් ගවේෂණ ඇත. මේවා එකිනෙකට මදක් වෙනස් අරුත් ගෙන දෙන යෙදුම් වන සාහිත්‍ය ගවේෂණ (literature search) හෝ "පූර්වකාලීන ගවේෂණ" (retrospective search) වශයෙන් විස්තර කළ හැකිය.

සාහිත්‍ය ගවේෂණයක මූලික පියවර මෙසේ හැඳින්විය හැකිය.

1. අවශ්‍ය තොරතුරු නිර්වචනය කිරීම.
2. තොරතුරු සෙවීමට ඉවහල් වන ඉහි සොයා බැලීම.
3. ගවේෂණ ප්‍රතිපත්තිය නිගමනය කර, ගවේෂණ ක්‍රම සහ ගවේෂණ පද තෝරා ගැනීම.
4. ප්‍රයෝජනවත් විය හැකි ග්‍රන්ථ නාමාවලි (කර්තෘ, ග්‍රන්ථ නාමය යනාදී වශයෙන්) සියල්ල සටහන් කර ගැනීම.
5. පුස්තකාල සුචි, ප්‍රකාශිත අනුක්‍රමණිකා සහ ග්‍රන්ථ නාමාවලි පිරික්සීම.
6. තම පුස්තකාලයේ ඇති ද්‍රව්‍ය සොයා ගැනීම.
7. පුස්තකාලයේ නොමැති ද්‍රව්‍ය සොයා ගැනීමට උත්සාහ කිරීම (අදාළ වෙනත් පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථාන ඇමතීම/ඒවාට යාම)
8. එක්රැස් කරගත් ද්‍රව්‍යවල අදාළ බව තක්සේරු කිරීම.

මෙකී පියවරවල් අනුගමනය කිරීම සඳහා, උසස් මට්ටමක තොරතුරු ගවේෂණ හැකියාවන් තිබිය යුතුය. ගවේෂණය කරගෙන යන අතරතුර පවතින තත්ත්වයන් යටතේ ගත යුතු වන වැදගත් තීරණ රාශියකි. 5.1 රූප සටහන බලන්න. සාහිත්‍ය ගවේෂණයක වැදගත් පියවරවල සහ තීරණ ගත යුතු අවස්ථා විදහා දක්වන ප්‍රවාහ සටහනක් මෙහි දැක්විය හැක.

බොහෝ පාඨකයෝ දීර්ඝ කාලයක් පුස්තකාල භාවිතා කිරීමෙන් තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාවන් අත්පත් කර ගනිති. තවත් බොහෝ අය, දීර්ඝ කාලයක් පුස්තකාල ඇසුරු කළද, මෙම හැකියාවන් කිසිදු අත්කර නොගනිති. බොහෝ පුස්තකාලයන්හි තොරතුරු සෙවීමේ ක්‍රියාවලීන් පිළිබඳව විධිමත් හෝ අවධිමත් අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා පහසුකම් මෙනිලා දිස්වන අවාසනාවන්ත තත්ත්වයකි.

6. තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාවන් ප්‍රමාණවත් නොවීම නිසා හටගන්නා ඇතැම් ප්‍රවණතා

තොරතුරු සොයන්නවුන්ගේ වර්යා පිළිබඳ කරන ලද අධ්‍යයන කිහිපයකින් විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් අතර තොරතුරු සොයා ගැනීමේ තාක්ෂණය පිළිබඳව වැඩි කුසලතාවන්ගෙන් යුත් පාඨකයින් පිරිසක් ඇති බව පෙනී ගොස් ඇත. මොවුන් අතුරින් වැඩි දෙනා, තෝරාගත් තොරතුරු තම සම වෘත්තිකයින්ට ලබා දෙති. මෙම ප්‍රවණතාව ඉතා ප්‍රචලිතව දක්නට ලැබෙන බැවින් මෙවැන්නවුන් "තොරතුරු පිළිබඳ දෙරටු පාලකයින්" වශයෙන් හඳුන්වනු ලැබ ඇත. පුස්තකාල භාවිතා නොකරන්නාවූ හෝ තොරතුරු සෙවීමේ ක්‍රියාවලීන්හි නිරතවීමේ හැකියාව නොමැති අය තමන්ට සම වෘත්තිකයන් විසින් හඳුන්වා දෙනු ලබන අවධිමත් තොරතුරු මූලාශ්‍ර ප්‍රයෝජනයට ගිනිති. සම වෘත්තිකයන් හා සාකච්ඡා කිරීම මවුනට පුස්තකාලයක පොත් ගොඩවල් වල තොරතුරු සෙවීමට වඩා පහසු, ප්‍රසන්න, ඉක්මන් සහ ඵලදායී ක්‍රමයක් වෙයි. එබඳු පිළිවෙත් මගින්, තොරතුරු භාවිතයට යටින් ඇති යථාර්ථය තම් පුස්තකාල පාඨකයින්ට ඵලදායී පුස්තකාල අධ්‍යාපනයක් ලබාදීම සඳහා වඩාත් ක්‍රමවත් වූත්, පිළිගත හැකිවූත් ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාවයි.

7. තොරතුරු සෙවීමේ හැකියාව වැඩිදියුණු කිරීම

පුස්තකාලයාධිපතීන් පිළිබඳව තම පුස්තකාල පාඨකයින්ට දැනුවත් කිරීමේ වගකීම සැලකිය යුතු ප්‍රමාණයකට භාරගත යුතුය. ලුහුබු හැඳින්වීමේ පාඨමාලා/පුහුණු සැසිවාර සංවිධානය කිරීමෙන් හෝ මෙම ක්‍රියාවල් පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයින්ට උපකාර කිරීමෙන් පුස්තකාලයාධිපතීන්ට, මෙම ව්‍යායාමයට මූලිකව සහාය විය හැකිය. එබඳු උගැන්මක් මගින්, පුස්තකාල භාවිතා කරන පාඨකයිනට, තම පුස්තකාලයන්ගෙන් උපරිම ඵල නෙලාගත හැකි වනු පමණක් නොව, පුස්තකාල සම්පත් සේවා පුස්තකාල භාවිත කරන්නවුන් විසින් වඩාත් හොඳින් උපයෝජනය කර ගැනීමටද මග පෑදෙනු ඇත.

එබඳු පුහුණු සැසි වාරයන්හි වඩාත්ම තීරණාත්මක සාධකය වනුයේ තොරතුරු සෙවීමේ දක්ෂතා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් අත්පත් කර ගැනීමට පුස්තකාල පාඨකයින් තුල තිබිය යුතු උනන්දුවයි. මෙය වෙනත් කිසිවකින් ආදේශ කළ නොහැකි අතිවාර්යයෙන් තිබිය යුතු සාධකයකි. උසස් අධ්‍යාපන ආයතනයන්හි තම්, ආචාර්යවරුන් තම සිසුන්ට පැවරුම් හා ව්‍යාපෘතීන් හාර දීමෙන් ශිෂ්‍යයින් පුස්තකාල භාවිතයට ක්‍රියාශීලීව උනන්දු කරවීමේ හැකියාව ඇත.

තොරතුරු සැකසීමේ සියළුම ක්ෂේත්‍රයන්හි වැඩිවෙමින් පවතින පරිගණක භාවිතයත්, CD-ROM දත්ත පදනම් පහසුකම් හා විද්‍යුත් තැපැල් සේවා, වල සිට INTERNET දක්වා ව්‍යාප්තව ඇති පරිගණක පද්ධති පහසුකම් භාවිතයන් නිසා, නව තාක්ෂණික ආරකට යොමුවන පුස්තකාලයන්ගෙන් උපරිම ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට තම්, පුස්තකාල භාවිතා කරන පාඨකයන් තොරතුරු සෙවීමේ නව හැකියාවන් සමුදයක් තමන් වෙත ආරෝපණය කර ගැනීම අවශ්‍ය වනු ඇත.

8. සමාප්තිය

ඵලදායී පුස්තකාල සේවාවක් සැලසීමෙන් පමණක් පුස්තකාල සම්පත් භාවිතය උපරිම වශයෙන් සිදු නොවේ. පුස්තකාල සම්පත්වල නිසි ප්‍රයෝජන ලබා ගැනීමට තම් ඒවා සොයා ගැනීම සහ භාවිතය සඳහා පුස්තකාල පාඨකයින් තුල විශේෂ හැකියාවන්

තිබීම අවශ්‍ය වේ. පාඨකයා විසින් හඳුනා ගත්නා පුස්තකාල ද්‍රව්‍ය සොයා දීම නිසැකවම පුස්තකාල සතු කාර්යයක් වුවත්. තොරතුරු සොයන්නා නොදන්නා වෙනත් අදල ද්‍රව්‍ය රාශියක් පුස්තකාලය තුල තිබීමට ඉඩ ඇති බැවින් පාඨකයා විසින්ම තොරතුරු සොයා ගැනීමේ හැකියාව ලබා ගැනීමේ වැදගත්කම අනිවාර්යයෙන්ම පැන නගිනු ඇත.

තොරතුරු සෙවීමේ ක්‍රියාවලිය පිළිබඳව පාඨකයා දැනුවත් කිරීමේ කාර්යය පුස්තකාලය මගින් මූලාරම්භය කළ යුතු බැවි නිසැකව කිව හැක. පුස්තකාල වැඩ සටහන්වල සාර්ථකත්වය රඳ පවතිනුයේ. තමන් ඒ පිළිබඳව දක්වන උනන්දුවේ ප්‍රමාණය මත බැවි පාඨකයා විසින් වටහාගත යුතුය. පාඨක අධ්‍යාපනය යනු පුස්තකාල-යාධිපතිවරුන්ද. පුස්තකාල පාඨකයින්ද. අන්‍යෝන්‍ය විශ්වාසයෙන් යුතුව. කාර්යක්ෂමව ඉටු කරන ඒකාබද්ධ ද්විපාර්ශවීය පරිශ්‍රමයක් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුව තිබේ.

වැඩිදුර කියවීම් ලැයිස්තුව :

1. CAREY, R.J.P. Finding and using teachnical information. London: Arnold, 1966. 153p.

2. EVANS, A.J. and others. Education and training of users of scientific and technical information : UNISIST guide for teachers. Paris: Unesco. 1977. p143.

3. LUBANS. J. Educating the library user. New York : Bowker, 1974. 435p.

4. Use, misuse and non-use of academic libraries. Proceedings of the New York Library Association - College and University Libraries Section Spring Conference held on 1st and 2nd May 1970.





රූප සටහන 5.1 : සාහිත්‍ය ගවේෂණයක ප්‍රවාහ සටහන්

VIDUS 18 - 1/2 ; 13

වැඩි ප්‍රයෝජනයක් සඳහා පුස්තකාල සංවිධානය

එන්.යූ. යාපා
ප්‍රධාන පුස්තකාලයාධිපති
ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකාරිත්ව ආයතනය.

හැඳින්වීම

පුස්තකාලයක් යනු මනාව සංවිධානය කරනු ලැබූ තෝරාගත් ලේඛන සංචිතයකි. පුස්තකාලයක් මගින්, එයට අයත් ලේඛන මෙන්ම වෙනත් පුස්තකාල වලින් එයට ලබාගත හැකි ලේඛන ද හාවිතා කිරීමට පහසුකම් සැලසේ.

පුස්තකාලය එහි පාඨකයිනට වඩාත්ම උචිත ලේඛන තෝරා ගනියි. ඒවා ප්‍රමුඛතා පදනමක් මත සපයා ගනියි: පහසුවෙන් සොයා ගත හැකිවන පරිදි සංවිධානය කර තබයි: ඒවායේ අන්තර්ගතය අනාවරණය වන පරිදි විශ්ලේෂණය කරයි: තොරතුරු සොයා ගැනීම පහසුකරලීම සඳහා තොරතුරු මෙවලම් සකස් කරයි. එබඳු ලේඛන ඇති බවට පාඨකයින් දැනුවත් කරයි: අනාගතයේදී හාවිතය සඳහා සංරක්ෂණය කරනු ලබයි.

පුස්තකාල කටයුතු පුළුල් වශයෙන් ක්ෂෙත්‍ර තුනකට බෙදේ:

පුස්තකාල පරිවය
ප්‍රලේඛනකරණය
තොරතුරු සේවා

තමන්ගේ අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය දැ තෝරා ගැනීම පිණිස තොරතුරු මූලාශ්‍ර තමන්ම පරීක්ෂා කිරීමට කැමති පාඨකයින්, එසේ කිරීම සඳහා පුස්තකාල වෙත පැමිණීම දිරි ගැන්විය යුතුය. සංචිතයෙන් වැඩි කොටස, නිදහසේ පොත්පත් පෙරලා (අනියම් ලෙස) කියවීමට කැමැත්ත දක්වන පාඨකයින්ට හාවිතා කළ හැකි පරිදි සංවිධානය කරනු ලැබේ. විශේෂයෙන්ම ඉඩකඩ පිරිමැසීමේ අරමුණින් ප්‍රකාශන සුළු ප්‍රමාණයක හාවිතය සීමා කිරීමට සිදුවේ. තවද, පුස්තකාල වෙත පැමිණීමට අපහසු පුද්ගලයින්ට ප්‍රයෝජනවත් වන ලෙස පුස්තකාල සේවා ව්‍යාප්ත කිරීමටද කටයුතු කෙරේ.

2. පුස්තකාල පරිවය

පුස්තකාල පරිවයත්හි අරමුණ වන්නේ වඩාත්ම යෝග්‍ය ලිපිලේඛන එක්රැස් කර ඒවා හාවිතයට පහසුකම් සලසා දීමයි. මෙම පරිවයත් අතුරින් පාඨකයින් කෙරෙහි වඩාත්ම බලපාන්නේ පහත සඳහන් ඒවාය.

සංචිත ප්‍රවර්ධනය කිරීම
සංචිත සංවිධානය
සංචිත උපයෝගීකරණය
සංචිත සංරක්ෂණය.

2.1 සංචිත ප්‍රවර්ධනය

පුස්තකාලයේ ඇති ලේඛන එකතුව, විවිධ පාඨකයින්ගේ වත්මත් සහ අනාගත අවශ්‍යතා සපුරාලීමට සමත් විය යුතුය. පුස්තකාල විසින්

යෝග්‍යවූත්. කාලීනවූත්. නිරවද්‍ය වූත්. විධිමත් වූත් තොරතුරු සැපයීම අරමුණු කරගෙන සංචිත ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබයි.

සංචිත ප්‍රවර්ධන ප්‍රතිපත්තිය පහත සඳහන් පරාමිතීන්ගෙන් සමන්විතය.

(i) විෂය : හර විෂයයන්. ආශ්‍රිත විෂයයන් සහ සාමාන්‍ය විෂයයන් නිර්ණය කිරීම. ඒ ඒ විෂය සඳහා අනුයුක්ත කර ඇති සම්පත් (අරමුදල්. ඉඩකඩ සහ කාර්ය මණ්ඩලීය කාලය) නිශ්චිතව දැක්වීම.

(ii) මාධ්‍යය : සංචිත ප්‍රවර්ධනයේ දී පනහකට වැඩිවූ විවිධ තොරතුරු මාධ්‍යයන් අතුරින් සාමාන්‍යයෙන් පුස්තකාලයක් විසින් තෝරා ගනු ලබන මාධ්‍යයන් මෙසේය.

මුද්‍රිත	-	පොත්. වාරප්‍රකාශන. වාර්තා
දෘෂ්‍ය	-	සිතියම්. චිත්‍ර
ශ්‍රව්‍ය දෘෂ්‍ය	-	වීඩියෝ සහ චිත්‍රපටල
සූක්ෂම ජායා	-	සූක්ෂම පත්‍රිකා (මයික්‍රෝෆිෂ්)
ඉලෙක්ට්‍රොනික	-	සීඩී-රොම් (CD-ROM), ඩිස්ක්

(iii) භාෂාව : පාඨකයින්ට හුරුපුරුදු භාෂාව අවධාරණ යෙන් සලකනු ලැබේ. ජාතික (සිංහල. දෙමළ සහ ඉංග්‍රීසි) භාෂා වලට ප්‍රමුඛත්වය දිය යුතුය. පාඨකයිනට වෙනත් භාෂා භාවිතා කිරීමේ හැකියාව ඇත්නම්ද. අදාල විෂය පිළිබඳ තොරතුරු ලබාගත හැක්කේ කිසියම් භාෂාවකින් පමණක් නම්ද. එබඳු වෙනත් භාෂාවන් පිළිබඳවද සැලකිල්ලක් දැක්විය යුතුය.

(iv) තෝරා ගන්නා පාඨක වර්ග :
විවිධ පාඨක වර්ග ඇත්නම් සම්පත් අත්කර ගැනීමේදී ප්‍රමුඛත්වය දිය යුතු පාඨක වර්ගය තෝරා ගනු ලැබේ.

පොදුවේ ගත් කල. එකිනෙකට වෙනස් පාඨක වර්ග අටකි. කිසිදු පුස්තකාලයකට එකී වර්ග සියල්ලට අයත් පුද්ගලයින්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි සංචිතය ප්‍රවර්ධනය කළ නොහැකිය. මෙහිදී වඩාත්ම සුදුසු වර්ග තෝරා ගනු ලැබේ.

ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් පාඨක වර්ග හඳුනාගත හැකිය.

(අ) කලමණාකරුවන්
(ආ) අධ්‍යාපනඥයින්
(ඇ) පර්යේෂකයින්
(ඈ) ව්‍යාප්ති/සංවර්ධන සේවකයින්
(ඉ) මාධ්‍යවේදීන්
(ඊ) තොරතුරු විද්‍යාඥයින්
(උ) ශිෂ්‍යයින්
(ඌ) පොදු ජනතාව
මෙකී වර්ගවල අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල සංචිත ප්‍රවර්ධන කර පුස්තකාල සේවා සපයනු ලැබේ.

2.2 සංචිත සංවිධානය

සංචිත ප්‍රවර්ධන ප්‍රතිපත්තියට අනුව අත් කරගත් ලේඛන ඒවා උපයෝගී කර ගන්නා ආකාරය සහ ඒවායේ භෞතික ලක්ෂණ සැලකිල්ලට ගනිමින් වෙන් වෙන්වූ සංචිත කිහිපයක් වශයෙන් සංවිධානය කරනු ලැබේ. බැහැර දෙන පොත්පත් සංචිතය හැරුණු කොට අනෙකුත් සෑම සංචිතයකටම හඳුනා ගැනීමේ සහ සොයා ගැනීමේ පහසුව තකා "සංචිත ක්ෂේත්‍රයක්" යොදනු ලැබේ.

සාමාන්‍ය පුස්තකාලයක දක්නට ලැබෙන ප්‍රධානතම පොත්පත් ලිපිලේඛන සංචිත මෙහි පහත සඳහන් පරිදි වේ.

(අ) බැහැර දෙන ග්‍රන්ථ :

බැහැරදීම සඳහා ඇති ප්‍රධාන ග්‍රන්ථ සංචිතය: මෙම සංචිතය ඇමතුම් අංක පිළිවෙලට විවෘත රාක්කවල තැන්පත් කරනු ලැබේ. විෂයයන් වශයෙන් පුළුල් වර්ගීකරණයක් කරනු ලැබේ. ඇමතුම් අංකය (call number) පහත සඳහන් ආකාරයට සැකසී ඇත: පුළුල් විෂය අංකය. කර්තෘ ක්ෂේත්‍රය.

(ආ) විමර්ශන ග්‍රන්ථ :

විමර්ශන අගයක් ඇති ග්‍රන්ථ (ශබ්ද කෝෂ. නාමාවලි ආදිය) සහ නැවත සපයා ගැනීම අපහසු ග්‍රන්ථ (දුර්ලභ ග්‍රන්ථ). විමර්ශන ග්‍රන්ථ වශයෙන්

සැලකේ. මේවා සංචිතයක් වශයෙන් වෙනම සංවිධානය කරනු ලැබේ. පැරණි සංස්කරණයන් වෙනුවට නව සංස්කරණයක් ඇතුලත් කරමින් විමර්ශන ග්‍රන්ථ සංචිතය, වරින් වර කාලීන තත්ත්වයට පත් කරනු ලැබේ.

(ඇ) සුරක්ෂිතාගාරය :

පහත සඳහන් වර්ග වල ද්‍රව්‍ය රඳවා තැබීම සඳහා ලේඛන සුරක්ෂිතාගාරයක් බොහෝ පුස්තකාල විසින් පිහිටුවනු ලැබේ.

(i) ප්‍රකාශයට පත් නොකළ වාර්තා (සංකීර්ණ වූත් පටුවූත් විෂයයන් පිළිබඳව සකස් කෙරුණු පිටු කිහිපයකින් යුත් වාර්තා)
(ii) ලිපිවල ප්‍රතිමුද්‍රිත සහ ජායා පිටපත්: සඟරා ලිපිවල ප්‍රතිමුද්‍රිත, පුවත්පත් සහ සඟරා ලිපි පොත් පරිච්ඡේද ආදියේ ජායා පිටපත්

(iii) සම්මන්ත්‍රණ ලේඛන : සම්මේලන වලදී ඉදිරිපත් කළ පත්‍රිකා (සම්මේලන වාර්තා පොත් බැහැර දෙන අංශයේ තිබිය යුතුය)

(iv) තාඝණික සහ පර්යේෂණ වාර්තා

(v) ශාස්ත්‍රීය සහ උපාධි නිබන්ධන, පොත්පත්.සඟරා, සම්මේලන වාර්තා අත්කර ගත් විට ඒවා විශ්ලේෂනය කර සුරක්ෂිතාගාරය සඳහා සුදුසු දෑ තෝරා ගනු ලැබේ. සුරක්ෂිතාගාරය සඳහා ජායා පිටපතක් ලබාගත් විට මුල් ලේඛනය පිළිබඳ විස්තර (උපහරණය) ජායා පිටපතෙහි සටහන් කරනු ලැබේ.

(ඈ) වාරික ප්‍රකාශන : (serials)

මේවා වෙනම සංචිත කිහිපයක් වශයෙන් සංවිධානය කරනු ලැබේ.

(i) ප්‍රවර්තන වාර සඟරා :

මේවා, වර්ෂයේ ඉකුත් කලාප ද සමග සඟරා රාක්තවල ප්‍රදර්ශනය කරනු ලැබේ. ප්‍රදර්ශනය සඳහා ඉඩකඩ සීමිත වන බැවින්, ප්‍රවර්තන වාර සඟරා සංචිතයට ඇතුලත් කරනුයේ වැඩි ඉල්ලුමක් ඇති සඟරා පමණකි.

(ii) රැඳවුම් සඟරා :

මෙම සංචිතයෙහි තුන් වර්ගයක ප්‍රකාශන ඇතුලත් වෙයි.

- ප්‍රදර්ශන ඉඩකඩ මද නිසා ප්‍රවර්තන වාර සඟරා සංචිතයෙහි ඇතුලත් කළ නොහැකි ප්‍රවර්තන වාර සඟරා
- බඳිනු ලබන ස්ථිරව රඳවා ගන්නා සඟරා
- රඳවා ගැනීමේ කාලසීමාව තුළ තාවකාලිකව රඳවා ගන්නා සඟරා

(iii) බඳින ලද සඟරා :

පුස්තකාලය මගින් ස්ථිරව රඳවා ගන්නා සඟරා වෙනම එකතුවක් වශයෙන් සංවිධානය කරනු ලැබේ.

(iv) පුවත් පත්‍රිකා :

තෝරා ගත් පුවත් පත්‍රිකා වල වත්මන් කලාප ප්‍රවර්තන වාර සඟරා සංචිතයෙහි ප්‍රදර්ශනය සඳහා තැබෙයි: ඉතිරි ඒවා සියල්ල පුවත් පත්‍රිකා සංචිතයෙහි තැබිය හැකිය.

(v) වාර්ෂික වාර්තා :

තෝරාගත් ආයතනවල වැඩසටහන් සහ කටයුතු වාර්තා කෙරෙන වාර්ෂික වාර්තා, සංචිතයක් වශයෙන් වෙනම සංවිධානය කරනු ලැබේ.

(ඉ) සූක්ෂම ජායා :

විශේෂයෙන්ම ද්විතීය තොරතුරු මූලාශ්‍ර, සූක්ෂම පටල වශයෙන් ලබාගත හැක. ද්විතීය මූලාශ්‍ර, (අනුක්‍රමිකා ග්‍රන්ථ නාමාවලි, නාම සංග්‍රහ ආදිය) මුද්‍රිත මාධ්‍යයෙන් තබා ගැනීමට වඩා සූක්ෂම පටල වශයෙන් තබා ගැනීමෙන් ඒවා පරිහරණයට පහසුවන බැවින් පුස්තකාලයාධිපතිවරු ඒවාට කැමැත්තක් දක්වති. සූක්ෂම පටක වෙනුවට විද්‍යුත් මාධ්‍ය හාවිතයට එමින් පවතින නමුදු, ද්විතීය මූලාශ්‍ර රාශියක්ද විශේෂ ප්‍රාථමික මූලාශ්‍ර (උපාධි

නිබන්ධන යනාදී) ද තවමත් ලබා ගත හැක්කේ සූක්ෂම පටක වශයෙන් පමණකි.

මෙහිදී සූක්ෂම දර්ශක කියවීමේ (මයික්‍රෝෆිෂ් රීඩර්) යන්ත්‍රයක් පුස්තකාලයේ තිබිය යුතුය.

(ඒ) ශ්‍රව්‍ය දෘෂ්‍ය මූලාශ්‍ර :

ශ්‍රව්‍ය දෘෂ්‍ය මූලාශ්‍ර අධ්‍යාපනික අරමුණු උදෙසා ඉතා සාර්ථක මූලාශ්‍ර වශයෙන් භාවිතා වෙයි. පුහුණු සහ ප්‍රචාරණ කටයුතු වල නියැලී සංවිධාන, ශ්‍රව්‍ය දෘෂ්‍ය මූලාශ්‍ර කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වයි.

(උ) විද්‍යුත් මාධ්‍ය :

දත්ත ගබඩා කිරීමේ සහ ලබා දීමේ (සමුද්ධරණ) පද්ධතීන්හි බහුලව භාවිතයට ගත්නා විද්‍යුත් මාධ්‍ය ගණනාවක් තොරතුරු තාක්ෂණය මගින් බිහිකොට ඇත. විද්‍යුත් මාධ්‍ය මගින් පෙළ, විමර්ශණ, රූප සහ හඩ සංඛ්‍යාංක වශයෙන් තැන්පත් කර ගැනේ.

විද්‍යුත් මාධ්‍ය ඉඩකඩ ඉතිරිය අතින් පිරිමැසුම්දායී වීමට අමතරව තවත් ප්‍රයෝජන කිහිපයක් සලසයි.

(i) එමගින් ඉතා ඉක්මණින් තොරතුරු නුවමාරුව සහ තැන් මාරුව කළ හැකිය.

(ii) තොරතුරු සමුද්ධරණය වඩාත් කාර්යක්ෂම කළ හැකිය.

(iii) පහසුවෙන් ලියවිලි (මුද්‍රිත) බවට පරිවර්තනය කළ හැකිය.

(iv) විවිධ ආකෘතීන් අනුව සකස් කර තොරතුරු ලබාගත හැකිය. (නිර්යාතයන්හි (out put) තොරතුරු කැමති පිළිවෙලකට සංවිධානය කර ලබාගත හැකිය)

සංචිතයේ පහත සඳහන් ආකාරයේ ද්‍රව්‍ය අඩංගු වනු ඇත.

CD ROM	-	සමස්ථ පෙළ
CD ROM	-	ග්‍රන්ථාවලි යොමු
CD ROM	-	රූප සටහන් (සිතියම් පින්තූර යනාදිය)
ඩිස්කට්	-	ග්‍රන්ථාවලි යොමු
ඩිස්කට්	-	රූප

(ඌ) සිතියම් සංචිතය :

පොදු සිතියම් සහ පුස්තකාලයේ විෂයයනට අදල සිතියම් වෙනම සංචිතයක් වශයෙන් සංවිධානය කෙරේ. මෙම සංචිතයට තනි ඉරු වශයෙන් මුද්‍රණය කළ සිතියම් මෙන්ම, විවිධ ලේඛන වලින් උපුටාගත් සිතියම් ද ඇතුලත් වනු ඇත.

(එ) පුවත් කැපුම් සංචිතය :

කෙටි ලිපි, නිවේදන, ප්‍රවෘත්ති, දැන්වීම් ප්‍රවෘත්තිමය විෂයයන්, ආදිය කපා ඉවත් කොට සංචිතයක් වශයෙන් සංවිධානය කරනු ලැබේ.

(ඒ) පැතිකඩ සංචිතය :

පැතිකඩක් යනු කිසියම් නිශ්චිත මාතෘකා වකට අදල ලේඛන එකතුවකි. තුන් ආකාරයක කරුණු පිළිබඳව පැතිකඩ සකස් කෙරේ.

(i) විෂය හෝ සිදුවීම
(ii) පුද්ගලයෙකු
(iii) සංවිධාන

පැතිකඩ තැන්පත් කර තිබීම සඳහා ගොනු මලු භාවිතා කරනු ලැබේ.

2.3 සංචිත උපයෝගීකරණය

(අ) කියවීමේ පහසුකම්

පුස්තකාලයක මූලික කාර්යය වනුයේ කියවීමේ පහසුකම් සැලසීමය. පුස්තකාල මගින් ඒවා කරා ඵලැඹෙන පාඨකයින්ට ප්‍රමාණවත් කියවීමේ පහසුකම් සැලසීමට ප්‍රයත්න දරනු ලැබේ. පුස්තකාලය වෙත පැමිණෙන්නවුන් තුන් ආකාරයකට කියවීමේ යෙදෙන බැවි කරතලද

විශ්ලේෂණ වලින් පෙනී ගොස් ඇත. ඒ අනුව, නිදහසේ විවේකීව කියවීම, කඩිනමින් කියවීම හා අධ්‍යයනය කරමින් සාවධානව කියවීම වැනි ත්‍රිම පාඨකයින් අනුගමනය කරන බැවි පෙනිගොස් ඇත.

ඵනියා පුස්තකාලයේ ඇති ඉඩකඩ ප්‍රමාණය අනුව ඒ ඒ ආකාරයේ කියවීම සඳහා ඉඩකඩ සපයනු ලැබේ.

(i) විවේකීව කියවන අංශය -

සඟරා සහ පුවත්පත් අතියම් ලෙස පෙරළා කියවිය හැකිවනු පිණිස මෙම කොටසෙහි ප්‍රවර්තන ප්‍රකාශන තැන්පත් කරනු ලැබේ. මිටි මේස සමග පැටියක් මෙහි තැන්පත් කෙරේ.

(ii) සැහැල්ලුව කියවීමේ අංශය -

විමර්ශණ ග්‍රන්ථ සහ ලිපිලේඛන ලැසිව කියවීම හා පරිලෝකණ සඳහා මේස සහ පුටු මෙහි තැන්පත් කෙරේ.

(iii) අධ්‍යයන අංශය -

සාවධානව කියවීම සඳහා වෙන් කෙරේ. හුදකලාව කියවීමට කැමති පාඨකයින් සඳහා නිස්තලංක, බාධාවකින් තොර වාතාවරණයක් සකස් කර දීම සඳහා, ඇතැම් පුස්තකාල විසින් කුටි සකස් කරනු ලබයි.

කියවන කුටිය - කියවන පුවරුවක් සහ විදුලි පහනක් සහිතය.

ශ්‍රව්‍ය දෘෂ්‍ය කුටි - ශ්‍රව්‍ය දෘෂ්‍ය මූලාශ්‍ර භාවිතය සඳහා රූපවාහිනියක්, කැසට් වාදන යන්ත්‍ර (ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය) සහ "හෙඩ් ෆෝන්" උපකරණ සහිතව

පරිගණක කුටිය - මාර්ග ගත දත්ත පදනම් සහ CD-ROM භාවිතය සඳහා තිරය සහිත මොනිටරය, යතුරු පුවරුව සහ CD-ROM යන්ත්‍රය සහිතව

මයික්‍රෝෆිෂ් කුටි - සුසඳම පත්‍රිකා (මයික්‍රෝෆිෂ්) කියවීම සඳහා කියවන යන්ත්‍රයක් සහිතව

(ආ) බැහැරදීම

පොත් සහ වාරසඟරා සීමිත කාලයක් සඳහා සාමාජිකයිනට බැහැර ගෙන යාම පිණිස පිරුළට දෙනු ලැබේ. ඒ ඒ කාණ්ඩවල සාමාජිකයිනට බැහැර ගෙන යාමට දෙනු ලබන ද්‍රව්‍ය වර්ග, වරකට තිකුත් කරන සංඛ්‍යාව, එසේ පිරුළට දෙනු ලබන කාලසීමාව යනාදිය නිශ්චය කෙරෙන බැහැරදීමේ ප්‍රතිපත්ති සකස් කරගත යුතුය.

(i) පෞද්ගලික බැහැරදීම් : පෞද්ගලික සාමාජිකයෙකුට පිරුළට දෙනු ලබන පුස්තකාල ද්‍රව්‍ය. (පොත් සහ සඟරා)

(ii) පුස්තකාලයාන්තර බැහැරදීම් : සාමාජික ආයතන වලට සහ තොරතුරු පද්ධතීන්හි සාමාජික පුස්තකාලයනට පිරුළට දෙන පුස්තකාල ද්‍රව්‍ය (පොත්, සඟරා, ශ්‍රව්‍ය දෘෂ්‍ය යනාදිය)

3. ප්‍රලේඛනකරණය

3.1 ප්‍රලේඛන කාර්යයන්

ප්‍රලේඛනකරණයට අදල ප්‍රධාන කාර්යය වනුයේ, ලේඛනවල ගැබ්වී ඇති දත්ත, පාඨකයිනට උපයෝජනය කරගත හැකි වන පරිදි නිරාවරණය කිරීමයි. මෙසේ ප්‍රලේඛනය මගින් තියළ ලේඛනයක් සක්‍රිය තොරතුරු මූලාශ්‍රයක් බවට පත් කරනු ලබයි. පුස්තකාලයක් විසින් අත් කරගනු ලබන ලේඛන විවිධ ශිල්පක්‍රම අනුව සකසනු ලැබේ.

(i) විශ්ලේෂණය - වැදගත් කොටස් හඳුනා ගැනීම

(ii) වර්ගීකරණය - විෂයයන් ඒවායේ සම්බන්ධතාව මත වර්ග කිරීම

(iii) සුවිගතකරණය - පහසුවෙන් හඳුනා ගැනීම සඳහා විස්තර කිරීම

:iv) අනුක්‍රමණිකා කරණය - තොරතුරු පහසුවෙන් සමුද්ධරණය කර ගැනීම සඳහා ප්‍රවේශ ලක්ෂ සපයාදීම

(v) පැනිකඩ සැකසීම - කිසියම් මාතෘකාවකට අදලව විශ්ලේෂණ කරනු ලැබූ අංග එකලස් කිරීම

:vi) පරිවර්තනය - ලේඛන එක් භාෂාවකින් තවෙකකට පරිවර්තනය කිරීම

3.2 විශ්ලේෂණය

ප්‍රලේඛනකරණයේදී ලේඛන දෙආකාරයකට හඳුනාගනු ලැබේ.

(i) ප්‍රධාන (මවු) ලේඛනය (ii) සුලු (දරක) ලේඛනය සුලු ලේඛනය යනු ප්‍රධාන ලේඛනයේ අනන්‍යතාවය නොමැතිව හඳුනාගත නොහැකි එහි කොටසකි. සුලු ලේඛන ඒවායේ කතෘත්වය හෝ විෂය අනුව. ප්‍රධාන ලේඛන වලින් වෙන් කොට හඳුනා ගනු ලැබේ.

ප්‍රධාන ලේඛනය	සුලු ලේඛන
ග්‍රන්ථය	පරිච්ඡේදය.සිතියම.ග්‍රන්ථ විමර්ෂණ
සඟරාව	ලිපිය. නිවේදනය
සම්මන්ත්‍රණ	
වාර්තාව	පත්‍රිකාව
පුවත් පත්‍රිකාව	ප්‍රවෘත්තිය. නිවේදනය
පුවත්පත	පුවත්පත් ලිපිය.ප්‍රවෘත්තිය

විශ්ලේෂණය යනු. ප්‍රධාන ලේඛන සුලු ලේඛන වලට වෙන් කිරීම සහ උද්දීපනය කළයුතු වැදගත් සුලු ලේඛන හඳුනා ගැනීමයි. ප්‍රධාන ලේඛනයෙන් සුලු ලේඛන උදෘත කර ගැනීම පිළිබඳව තීරණයක් ගත යුතුය. ප්‍රධාන ලේඛනයක් කාල නියමයකින් තොරව රඳවා නොගන්නේ නම් හෝ ප්‍රධාන සහ සුලු ලේඛන දෙක වෙන වෙනම සංචිත දෙකකට යා යුතු නම්. සුලු ලේඛනයෙහි ජායා පිටපතක් ගත යුතුය. සුලු ලේඛනය සම්පූර්ණයෙන් හඳුනා ගත හැකිවනු පිණිස එහි ප්‍රධාන ලේඛනයේ නාමාවලි උපහරණය (citation) සඳහන් කළ යුතුය.

ප්‍රධාන ලේඛන විශ්ලේෂණය මෙහි පහත විස්තර කෙරෙන පරිදි වේ.

(අ) ග්‍රන්ථ : පුස්තකාලය අවධානය යොමු කරන හර (core) විෂයයන්ට අදල පරිච්ඡේදයක් ග්‍රන්ථයක තිබිය හැකිය. එය ප්‍රලේඛනගත නොකළහොත් එය තිබෙන බැවි පාඨකයින් නොදැනගනු ඇත. එම ග්‍රන්ථය සංචිතයට එක් නොකරන්නේ නම් අදල පරිච්ඡේදයෙහි ජායා පිටපතක් ගෙන ඊට එක් කෙරේ.

(ආ) සඟරා : අනුක්‍රමණිකාකරණය (Indexing) සඳහා හර විෂය පිළිබඳ ලිපි හඳුනා ගැනේ. රඳවා නොගන්නා සඟරාවල ඇති අදල ලිපිවල ජායා පිටපත් ගනු ලැබේ.

(ඇ) ප්‍රවෘත්ති පත්‍ර සහ පුවත් පත්‍රිකා : මේවායින් උපුටා ගන්නා දෑ නම්:

- හර (core) විෂය පිළිබඳ ලිපි
- මවු සංවිධානයට අදල ප්‍රවෘත්ති
- පැතිකඩ ලේඛනයේ ඇතුලත් විද්වත් සංවිධාන සහ පුද්ගලයින්ට අදල ප්‍රවෘත්ති

(ඇ) සමුළු වාර්තා : සමුළු වාර්තාවල පළවන විෂයට අදල වැදගත් ලිපි. අනුක්‍රමණිකාකරණය සඳහා තෝරා ගනු ලැබේ. සමුළු වාර්තා රඳවා නොගන්නේ නම් මෙබඳු ලිපිවල ජායා පිටපත් ලබාගත යුතුය.

3.3 වර්ගීකරණය

වර්ගීකරණය යනු පුස්තකාල ද්‍රව්‍ය. විෂය අනුව සංවිධානය කිරීමේ ක්‍රමයකි. වර්ගීකරණ අංක අනුව විෂයයන් සංවිධානය කිරීමේදී සමාන විෂයයන් එක්තැන් වෙයි. මෙසේ කිරීමෙන් පාඨකයිනට සංචිතය අනියම් ලෙස කියවා පිරික්සීමෙන් යමක් සොයා ගැනීම පහසු වෙයි.

විෂය අනුව තොරතුරු සෙවීම සඳහා වර්ගීකරණය සතුටුදායක අන්දමින් යොදගත හැකි වුවත්, පරිගණක ආශ්‍රිත අනුක්‍රමණිකාකරණය තාක්ෂණය, විෂය අනුව තොරතුරු සෙවීමේ වඩාත් කාර්යක්ෂම බවට පත් කොට ඇත. එහෙයින් බොහෝ පුස්තකාල විසින් දැන් වර්ගීකරණය භාවිතා කරනු ලබන්නේ විෂය අනුව සංචිතය සංවිධානය කිරීම සඳහා පමණි. එබඳු පුස්තකාල විසින් වර්ගීකරණය යොද ගැනෙනුයේ, බැහැර දෙන සහ විමර්ෂන ග්‍රන්ථ, රාක්කවල තැන්පත් කිරීමේදී පමණි. රාක්කවල ඇසිරීමේදී, ගැඹුරින් වර්ග කිරීම අවශ්‍ය නොවන අතර, එහිදී පුස්තකාලයට පුළුල් වර්ග කිරීමක් අනුගමනය කිරීමේ හැකියාව ඇත.

ශ්‍රී ලංකාවේ පුස්තකාල විසින් රාක්කවල පොත් සංවිධානය කිරීම සහ සුචි හෝ දත්ත පදනම් වශයෙන් තොරතුරු සංවිධාන කිරීම සඳහා ජාත්‍යන්තර වර්ගීකරණ ක්‍රම උපයෝගී කරගනු ලැබේ. ඩිවී දශම වර්ගීකරණය Dewey Decimal Classification (DDC) ප්‍රධාන වශයෙන්ම මහජන, පාසැල් සහ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයන්හි වඩාත් ජනප්‍රියව භාවිතාවන ක්‍රමයයි. සංකීර්ණ විෂයයන් සඳහා නිශ්චිත වර්ග අංක සැපයීමෙහිලා විශ්ව

දශම ක්‍රමයට ඇති හැකියාව නිසා විද්‍යාත්මක සහ තාක්ෂණික පුස්තකාල මගින් විෂය අනුව ග්‍රන්ථ සංවිධාන යෙදීමට එම ක්‍රමය වැඩි වශයෙන්ම යොදා ගනු ලැබේ.

3.4 අනුක්‍රමණිකාරණය

අනුක්‍රමණිකාකරණය මගින් පුස්තකාල ද්‍රව්‍ය සොයා ගැනීම පහසු කරනු ලබයි. අනුක්‍රමණිකාකරණයේදී විෂයයක් නියෝජනය කිරීම සඳහා පද සහ වාක්‍ය ඛණ්ඩ භාවිතා කරනු ලැබේ. අනුක්‍රමණිකා ගත කරන්නවුනට, විෂයයන් සෙවීමේදී, භාවිතා වනු ඇත්තේ කවර පද දැයි පූර්වානුමානය කිරීමේ හැකියාව තිබිය යුතුය. ඒකාකාරීව අනුක්‍රමණිකා පද භාවිතය තහවුරු කරගැනීම සහ අනුක්‍රමණිකාකරණයේ දී පද තෝරා ගැනීමට මග පෙන්වීම සඳහා පාලිත වාග් මාලාවක් භාවිතා කෙරේ.

පුස්තකාල විසින් මෙබඳු පාලිත වාග් මාලා වශයෙන් පර්යාය කෝෂ හෙවත් විෂය විස්තර කාරිත්ව පද මාලා, භාවිතා කරනු ලැබේ. දෙආකාරයක පර්යාය කෝෂ මේ සඳහා භාවිතා කෙරේ. එනම් පොදු සහ විශේෂ පර්යාය කෝෂයි. පොදු පර්යාය කෝෂයන්ට සියළුම විෂය ක්ෂේත්‍රයන්ට අදාළ පද (විෂය විස්තරකාරක) ඇතුලත් වන අතර, විශේෂ පර්යාය කෝෂයෙහි ඇත්තේ විශේෂ විෂයකට අදාළ පදයි.

මෙසේ උපුටා ගනු ලබන පද, ආයති ලේඛනයෙහි ඇතුලත් කළ යුතුය. සිඩිඑස්/අයිසිස් වැනි පරිගණක මෘදුකාංගවලට කර්තෘ, ග්‍රන්ථනාමය, ග්‍රන්ථමාලා නාමය ආදිවූ ගවේශනශීලී ක්ෂේත්‍ර වලින් අනුක්‍රමණිකා පද ස්වයංක්‍රීයව උපුටා ගැනීමේ හැකියාවක් ඇත.

3.5 සුචිකරණය

පුස්තකාලයන්හි සුචිකරණ පරිවය සාමාන්‍යයෙන් ලේඛන විස්තර කිරීමට සීමා කෙරේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් භාවිතා වනුයේ AACR යනුවෙන් කෙටියෙන් හැඳින්වෙන ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීතිරීතියි.

ලේඛන සොයා ගැනීම පහසු කරලීම සඳහා පුස්තකාලය විසින් පත්‍ර සුචියක් (card cataloge) පවත්වාගෙන යනු ලැබේ. කර්තෘ, ග්‍රන්ථ නාමය, ග්‍රන්ථමාලාව සහ විෂය අනුව සෙවීම සඳහා මෙම සුචිය භාවිතා කළ හැකිය. මෙය කරනු ලබන්නේ ඉහත සඳහන් කළ සෙවීම් පද සඳහා වෙන වෙනම කාඩ්පත් පිළියෙල කිරීමෙනි. එහෙයින් එක් ලේඛනයක්, සුචියෙහි එකකට වැඩි කාඩ්පත් සංඛ්‍යාවකින් පෙන්නුම් කරනු ඇත.

පරිගණක භාවිතා කරන පුස්තකාල විසින් දැන් තම සුචි පරිගණකගත කරනු ලැබේ. පරිගණකයකට එක් රෙකෝඩයක් තුළ සෙවීම් පද එකකට වැඩි ගණනක් ඇතුලත් කළ හැකි බැවින්, විවිධ පද වෙනුවෙන් වෙන වෙනම සටහන් ගණනාවක් පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.

පරිගණකගත කළ පුස්තකාල විසින් නුදුරු අනාගතයේදී, පාඨකයින් සඳහා (Online public මාර්ගගත සුචි Access Catalogues) පහසුකම් සලසනු ඇත.

3.6 පැතිකඩ සැකසීම

පැතිකඩක් සඳහා විවිධ ලේඛන එකලස් කිරීමේ කාර්ය පැතිකඩ සැකසීම යනුවෙන් හැඳින්වේ. සුදුසු ලිපි ලේඛන තෝරා ගැනීම, අවශ්‍ය නම් පරිවර්තනය කිරීම, ඒවා කඩදාසිවල ඇලවීම, හඳුනා ගැනීම සඳහා සටහන් කිරීම සහ අදාළ ඩොකට්ටුවේ ගොනු කිරීම ආදිය පැතිකඩ සැකසීමට ඇතුලත් වෙයි. පැතිකඩ සැකසීම යනු 3.2 යටතේ සඳහන් කළ විශ්ලේෂන කටයුතු වලට වැඩිදුර කාර්යයකි. 2.2 (ඒ) හි සඳහන් කළ පරිදි පුස්තකාල විසින් තුන් ආකාරයකින් පැතිකඩ සකසා පවත්වා ගෙන යනු ලැබේ.

3.7 පරිවර්තන

පුස්තකාලයීය ප්‍රකාශනවල පළ කිරීම සඳහා තෝරා ගන්නා වැදගත් ලිපි, ප්‍රවෘත්ති සහ නිවේදන, අවශ්‍ය නම් ජාතික භාෂාවනට පරිවර්තනය කරනු ලැබේ. මේ සඳහා පුස්තකාලයේ පරිවර්තකයින්ගේ හෝ බාහිර පරිවර්තකයින්ගේ සහාය ලබා ගැනේ.

විදේශීය භාෂා වලින් පළවන, තෝරාගත් ලිපි ලේඛනවල පරිවර්තන සැපයීම සඳහා පුස්තකාල මගින් කටයුතු කරනු ලැබේ. මේ සඳහා පුස්තකාල මගින් පරිවර්තක මඩුල්ලක් පත් කෙරේ. භාෂා පරිවර්තකයින්ගේ ජීවදත්ත, භාෂාමය කුසලතාවන්, විෂයයන් පිළිබඳ විශේෂඥ දැනුම, සේවා කොන්දේසි යනාදිය ඇතුලත් නාම ලේඛනයක් පවත්වා ගත යුතුවේ.

3.8 සංස්කරණය

ප්‍රලේඛන ක්‍රියාවලියකින් බිහිවන තොරතුරු නිපැයුම්. සුදුසු ආකෘතිනට අනුව ඉදිරිපත් කළ යුතුය. පරිගණකයෙන් ලබා ගන්නා මුද්‍රිත ද්‍රව්‍ය. කපාගත් ලිපි ලේඛන. ජායාරූප. සිතියම්. ශීර්ෂ පාඨ. යනාදිය තියවීම සඳහා සුදුසු ආකෘතියකට අනුව සංවිධානය කිරීම සංස්කරණ කාර්යයට ඇතුලත් වෙයි. සංස්කාරක කටයුතු සඳහා චිත්‍ර කර්මය. පරිගණක රූපණ චිත්‍රක (graphics) යනාදිය පිළිබඳ දැනුමක් අවශ්‍ය වෙයි.

4. තොරතුරු සේවා

4.1 සංවිධාන

පාඨකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ තොරතුරු සේවා ක්‍රියාත්මක කිරීම. පුස්තකාලයක් සතු ප්‍රධානතම කාර්යයන් අතුරින් එකක් වෙයි. පාඨකයින් තම දැනුම පුළුල් කරගැනීම. තම ජ්වන තත්ත්වය වැඩිදියුණු කර ගැනීම යන අරමුණු ඇතිව පර්යේෂණ කිරීම. අධ්‍යයනය සහ විවේකාස්වාදය සඳහා තොරතුරු ගවේෂණය කරනු ලබති.

පාඨකයන්ට අවශ්‍ය තොරතුරු. ප්‍රධාන ආකාර හතරකට අයත් වේ.

(i) විමර්ෂණ - තොරතුරු මූලාශ්‍ර පිළිබඳ තොරතුරු (තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම. තෝරා ගැනීම සහ සොයා ගැනීම සඳහා සහාය වේ)

(ii) දත්ත - අවබෝධ කරගත හැකි තොරතුරු

(iii) සංඛ්‍යා ලේඛන - ප්‍රතිඵල. ප්‍රගතිය සහ ප්‍රවණතා පෙන්නුම් කිරීම සඳහා වගුගත කර ප්‍රදර්ශනය කරනු ලබන සංඛ්‍යානමය දත්ත

(iv) රූපණ (පිඹුරු) - සිතියම් චිත්‍ර සහ යනාදිය මගින් දත්ත රූපණ වශයෙන් ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් කළ තොරතුරු ග්‍රන්ථ. වාර ප්‍රකාශන. සමුළු වාර්තා. මුද්‍රණය නොවූ වාර්තා. ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ විද්‍යුත් මාධ්‍යයන්හි තැන්පත්ව ඇත.

පුස්තකාලයකට ඇති ලේඛන දෙවර්ගයකට අයත් වෙයි.

(i) සන්තක (පුස්තකාලය සතු ලේඛන)

(ii) ගෝචර (පුස්තකාලය හා සම්බන්ධිත දේශීය සහ විදේශ පුස්තකාලයන්හි ඇති ලේඛන)

පුස්තකාලය සතු සහ පුස්තකාලයට ලබාගත හැකි ලේඛන පිළිබඳ තොරතුරු පහත සඳහන් ආකාරයට අනුක්‍රමණිකා වලින් සහ දත්ත පදනම්වල ඇතුලත් කර තබයි.

(i) පුස්තකාලය විසින් සකස් කරනු ලැබූ සුවි. ග්‍රන්ථ නාමාවලි

(ii) තොරතුරු පද්ධතීන්හි හවුල්කරුවන් වන දේශීය පුස්තකාල පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ සුවි. ඒකාබද්ධ ලැයිස්තු. පරිග්‍රහණ ප්‍රකාශන යනාදිය

(iii) විදේශීය සංවිධාන සම්පාදනය කරනු ලබන අනුක්‍රමණිකා සහ සාර සංග්‍රහ වාර ප්‍රකාශන. ප්‍රවර්තන දැනුම සංග්‍රහ යනාදිය

පාඨකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල විසින් මෙකී තුන් ආකාරයේ තොරතුරු මෙවලම් උපයෝගී කර ගනු ලබයි. පුස්තකාලයක් මගින් නිතිපතා සළසනු ලබන තොරතුරු සේවා මෙහි පහත දැක්වේ.

4.2 විමර්ෂණ සේවා

පුස්තකාලයක විමර්ෂණ ග්‍රන්ථ සංචිතය පාඨකයන්ගේ නිශ්චිත ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගැනීමට ආධාරක වෙයි. විමර්ශන සේවාවේ කාර්යක්ෂමතාව සාධක තුනක් මත රඳ පවතියි.

(i) විමර්ෂණ පුස්තකාලයාධිපතීන්ගේ දැනුම සහ නිපුණතාවය

(ii) විමර්ෂණ ග්‍රන්ථ එකතුවෙහි පරිපූර්ණතාව

(iii) විමර්ෂණ ග්‍රන්ථ එකතුවෙහි ප්‍රවර්තනතාව

තැපැල් මගින් හෝ දුරකථනයෙන් විමසීමක් ලැබුණු විට. සැබෑ ප්‍රශ්නය අවබෝධ කර ගැනීම සඳහා එය

විශ්ලේෂණය කළ යුතුය. පුද්ගලිකව විමසීම ඉදිරිපත් කළ විට, සැබෑ අවශ්‍යතාව හඳුනා ගැනීම සහ පාඨකයාගෙන් විමසීමේ හැකියාව පුස්තකාලයට ලැබේ.

පාඨකයාගේ විමසුමට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය විමර්ෂණ ග්‍රන්ථ නොමැති නම් හෝ යල් පැනගොස් ඇති නම්, පුස්තකාලය විසින් එම ග්‍රන්ථය ඇති පුස්තකාලයක් අමතනු ඇත. වෙනත් පුස්තකාල සතු වැදගත් විමර්ෂණ ග්‍රන්ථ පිළිබඳ තොරතුරු පුස්තකාල විසින් සපයා තැන්පත් කර තබාගත යුතුය.

4.3 නිර්දේශක සේවා

අදාළ තොරතුරු නොමැතිවීම නිසා පිළිතුරු සැපයිය නොහැකි විමසීම් කිසිවක් වෙතොත් ඒවාට පිළිතුරු සැපයීමේ හැකියාව ඇති වෙනත් සංවිධානයකට යොමු කරනු ලැබේ.

නිර්දේශක සේවාවන් කාර්යක්ෂමව මෙහෙයවීමට නම් පුස්තකාලය විසින්, සම්බන්ධිත ආයතන සතු සම්පත් සහ හැකියාවන් අවබෝධ කරගතයුතුය. පුස්තකාලය මගින් සම්පාදනය කරනු ලබන පැතිකඩ සහ නාමාවලි වැනි තොරතුරු මෙවලම්, අදාළ ගැටළුවට පිළිතුරු සැපයීමේ හැකියාව ඇති බාහිර සංවිධාන හඳුනා ගැනීමට උපකාරී වනු ඇත.

4.4 තොරතුරු ගවේෂණ

පුස්තකාල විසින් තමන් විශේෂයෙන් අවධානය යොමු කරන විෂයයන්ට අදාළ තොරතුරු සෙවීමේ කටයුතු භාරගනු ලැබේ. විෂයයක් පිළිබඳ ලිපිලේඛන සෙවීම සඳහා 4.1 හි සඳහන් කළ තොරතුරු මෙවලම් (අභ්‍යන්තර, දේශීය සහ විදේශීය වශයෙන්) පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය තොරතුරු ගවේෂණය නිශ්චිතව ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් භාවිතා කරනු ලැබේ. තොරතුරු ගවේෂණය කළ යුතු විෂය, අදාළ කාලසීමාව, භාෂා මාධ්‍යය, ද්‍රව්‍ය වර්ගය යනාදිය නිර්ණය කිරීමට මෙම ඉල්ලුම් පත්‍රය උපකාරී වේ.

ගවේෂණ ප්‍රතිඵල සැකසීම සඳහා ගවේෂණ ඉල්ලුම් පත්‍රයක් යොදා ගනු ලැබේ. අභ්‍යන්තර දත්ත පදනම් සඳහා ප්‍රමිත ගවේෂණ ප්‍රකාශයක් අවශ්‍ය වන අතර, බාහිර දත්ත පදනම් සඳහා, විශේෂයෙන්ම CD - ROM දත්ත පදනම් සඳහා විශේෂිත ක්‍රම අවශ්‍ය වේ.
ගවේෂණයේ ප්‍රතිඵල නාමාවලියක් වශයෙන් සකස්කර, පාඨකයා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4.5 ප්‍රවර්තන සම්ප්‍රජ්ඤායන (Current Awawareness) සේවා

පාඨකයිනට ප්‍රවර්තන සම්ප්‍රජ්ඤායන සේවා සලසනු ලබන්නේ, පුස්තකාලයේ සංචිත වලට අළුතෙන් එකතුවන ලේඛන පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහාය. තම දැනුම අළුත් කර ගැනීම සඳහා නිතිපතා පුස්තකාලය වෙත පැමිණීමේ අපහසුතාවක් ඇති පාඨකයිනට මෙම සේවාව විශේෂයෙන් ප්‍රයෝජනවත් වෙයි.

අළුත් ලිපි ලේඛන විස්තර කරන පහත සඳහන් ප්‍රකාශන, ප්‍රවර්තන සම්ප්‍රජ්ඤායන සේවා සඳහා උපයෝජනය කරගනු ලැබේ.

(i) පුස්තකාල ප්‍රතිග්‍රහණ සංග්‍රහය - පුස්තකාලයට එක් කෙරෙන ග්‍රන්ථ, ශ්‍රව්‍ය දෘෂ්‍ය, නව වාර ප්‍රකාශන

(ii) පුස්තකාල අනුක්‍රමණිකාව - සහරා/ පුවත්පත් ලිපි, වාර්තා, සම්මන්ත්‍රණ ලිපි

(iii) සහරා පටුන - පුස්තකාලයට ලැබෙන පොත්පත් වලින් තෝරාගත් ඒවායේ පටුන පිටු

4.6 වරණීය තොරතුරු පරිවහන සේවා (Selective Dissemination of Information)

මෙම සේවාව සැලසුම් කර ඇත්තේ, පාඨකයිනට ඔවුන්ට අදාළ ප්‍රවර්තන තොරතුරු පමණක් සැපයීම සඳහාය. එක් එක් පාඨකයාට, ඔවුන් අවධානය දක්වන කරුණු අනුව තෝරාගත් ප්‍රවර්තන තොරතුරු සපයනු ලැබේ. තොරතුරු තේරීමේදී පුස්තකාලයෙහි පවත්වාගෙන යන පාඨක පැතිකඩ ප්‍රයෝජනයට ගනු ලැබේ.

එක් එක් පාඨකයා වෙනුවෙන් පාඨක පැතිකඩක් බැගින් නිර්මාණය කෙරෙනු ඇත. පැතිකඩ සඳහා තොරතුරු එක්රැස් කරනු ලබන්නේ පාඨකයාගේ

තොරතුරු අවශ්‍යතා සම්ක්ෂණයට සහ අගැයීමට හාජනය කිරීමෙනි. පැතිකඩයකට පහත සඳහන් තොරතුරු ඇතුලත් වනු ඇත.

(i) පෞද්ගලික - නම, ලිපිනය, තනතුර, සේවා ස්ථානය, අනුයුක්තිය

(ii) ක්‍රියාකාරකම් - පර්යේෂණ, උපදේශක

(iii) විෂයයන් - විෂය, ශීර්ෂ, යතුරුපද

(iv) දත්ත පදනම් - ගවේෂණය කළ යුතු දත්ත පදනම්

(v) සහරා නාම - ගවේෂණයන්ට ඇතුලත් විය යුතු සහරාවල නම්

ඉහත සඳහන් දත්ත වෙනස් වීමට ඉඩ ඇති බැවින්, අවධාන පැතිකඩ කලින් කලට සංශෝධනය කල යුතුය. මේ සඳහා පාඨකයින්ගේ ප්‍රතියෝජන වරින් වර ලැබිය යුතුය.

4.7 වරණිය පටුන පිටු පරිමපන සේවා

මෙම සේවාව මගින් පාඨකයින් විසින් තෝරා ගන්නා ලද සහරාවල පටුන පිටු ඡායා පිටපත් කර ඔවුන් වෙත යවනු ලැබේ. මෙය කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය (AGRINET) වැනි පුස්තකාල පද්ධති විසින් ඒකාබද්ධ වැඩ සටහනක් වශයෙන් සංවිධානය කර ඇත.

තමන් කැමති සහරා තම් කරන මෙන් පාඨකයන්ගෙන් ඉල්ලනු ලැබේ. සහරා නාම හඳුනා ගැනීම සඳහා පුස්තකාලවලට ලබා ගන්නා සහරා ලැයිස්තුවක් පාඨකයින්ට සපයනු ලැබේ. එක් එක් පාඨකයා විසින් තෝරා ගනු ලබන සහරා නාම ඔවුන්ගේ පැතිකඩෙහි ඇතුලත් කරනු ලැබේ.

පාඨකයින් විසින් පටුන පිටුවෙන් තෝරා ගන්නා සහරා ලිපි වල ඡායා පිටපත් සැපයීමේ කාර්යය පුස්තකාලය මගින් හාරගනු ලැබේ.

5 සමාප්තිය

පුස්තකාල සේවාවන්ගේ සඵලතාව බොහෝ දුරට රඳ පවතිනුයේ පුස්තකාල කාර්ය මණ්ඩලයේ කුසලතා සහ ඔවුන්ගේ ආකල්ප මතය. පුස්තකාල සේවා සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පවත්වාගෙන යාම සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලය ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍යය. පුස්තකාල අධ්‍යාපනය, පුහුණුව, හදෑරීම සහ වෘත්තීය කටයුතුවල නියැලීම තුලින් වෘත්තීය කුසලතා සහ දැනුම ලබාගත හැකිය. වෙනත් පුස්තකාලයන්හි ඇති සම්පත් උපයෝගී කර ගැනීම සඳහා පුස්තකාලයාධිපතිවරයෙකු සතු හැකියාව රඳ පවතිනුයේ ඔහු හෝ ඇය අනෙකුත් පුස්තකාලයාධිපතිවරුන් සමග ඇති කරගන්නා පෞද්ගලික සම්බන්ධතා මතය.

ඕනෑම වේලාවකදී පාඨකයිනට සේවා සැලසීමටත්, ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමටත් පුස්තකාල-යාධිපතිවරයා සූදානමින් සිටිය යුතුය. ඔහු/ඇය පාඨකයන්ට වහා ලභා විය හැකි හා ඕනෑම අවස්ථාවක බාධා කළ හැකි අයෙකු විය යුතුය.

vidus 18-1/2-23

පරිගණක තාක්ෂණය හේතුවෙන් පුස්තකාලයට නව මුහුණුවරක්

ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
භෞතිය විද්‍යා අධ්‍යයන අංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
පොල්ගොල්ල.

1995 වසර අවසානයේ විවෘත කෙරුණු ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝර්නියා විශ්ව විද්‍යාලයේ අළුත්ම මණ්ඩපයට අයත් වන ගොඩනැගිලි සමූහය තුළ එක් පැහැදිලි අඩුපාඩුවක් වෙයි. එනම් පුස්තකාලයක් නොමැතිවීමයි. මෙය සැලසුම්කරුවන්, ඉංජිනේරුවන් හෝ කම්කරුවන් අතින් වූ අතපසුවීමක් නොවේ. විශ්ව විද්‍යාල බලධාරීන් විසින් හිතාමතාම ගත් තීරණයකි. "අප පුරුදුවී සිටිනා අන්දමේ සම්ප්‍රදායික පුස්තකාල ඉදිකිරීමේ අවශ්‍යතාවයක් දැන් නැතැ" යි මණ්ඩප 22 කින් සමන්විත කැලිෆෝර්නියා සරසවියේ කුලපති බැරී මුනිට්ස් පවසයි. කොම්පියුටරයන් හරහා තොරතුරු ලභා වන තාක්ෂණයක් අප සතුව තිබියදී සුවිසල් ගොඩනැගිලි වලට, දහස් ගණන් වටිනා පොත්පත් වලට අනවශ්‍ය ලෙස මුදල් වියදම් කිරීමේ තේරුමක් නැතැයි ඔහු තවදුරටත් කියයි.

තොරතුරු තාක්ෂණයේ ඵලතෙළීම අතින් ඇමරිකා එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාලයන් මේ වන විටත් සෙසු ලෝකයා අභිබවා ඉදිරියට ගොස් සිටිති. මෙම විශ්ව විද්‍යාලවල පරිපාලන කටයුතු පමණක් නොව අධ්‍යයන කටයුතු වලින්ද වැඩිහරියක් සිදු වන්නේ පරිඝණක සංනිවේදන ජාලයන්ගේ ආධාරයෙනි. වෙනකක් තබා, විෂය නිර්දේශයන් හා දේශන සටහන් ශිෂ්‍යයන් වෙත ලබාදීමටත් විභාග පැවැත්වීම සඳහාත් විශ්ව විද්‍යාල ආචාර්යවරු මෙම පරිඝණක සන්නිවේදන ජාලයන් උපයෝගී කර ගනිති.

විද්‍යා පර්යේෂණ ලිපි ප්‍රකාශනය සම්බන්ධයෙන්ද විශේෂ බලපෑමක් ඇති කිරීමට පරිඝණක තාක්ෂණය සමත්වී ඇත. එනම් සන්නිවේදන අන්තර් ජාලය හරහා සිය පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ඉතා ඉක්මණින් සෙසු ලෝකයා වෙත ලබාදීමේ අවස්ථාව දැන් විද්‍යාඥයිනට ලැබී තිබේ.

මෙතෙක් පවත්නා සම්ප්‍රදායික පිළිවෙතට අනුව පර්යේෂණයක ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම යනු දීර්ඝකාලීන ක්‍රියාදමයකි. එනම් කිසියම් පර්යේෂකයෙකු විසින් තමන්ගේ අත් පිටපත (නැතහොත් විද්‍යාත්මක ලේඛනය) පිළිගත් විද්‍යා සහරාවකට යොමු කළ විට මුලින්ම එය අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණ විශේෂඥයන් දෙදෙනෙකුගේ හෝ තිදෙනෙකුගේ විවේචනාත්මක ඇගයීම් සඳහා යොමු කෙරේ. අත් පිටපත සංස්කරණය සඳහා යොමු වන්නේ ඔවුන්ගේ ඇගයීම් ලැබුණාට පසුවය.

කවර විද්‍යාත්මක පර්යේෂණයක වුවද ප්‍රතිඵලයක් නැතහොත් නව සොයා ගැනීමක් ප්‍රකාශයට පත් කිරීම අරගයා මෙවැනි දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම අවශ්‍ය යැයි පිළිගත යුතුව ඇතත් මෙම ක්‍රියාවලිය සිදුවන වේගය කිසිසේත්ම සතුටුදායක නොවන බව බොහෝ දෙනෙකුගේ පිළිගැනීමයි. උදහරණයක් ලෙස සමහර පර්යේෂණයන්හි ප්‍රතිඵල ප්‍රකාශයට පත් වන්නේ අදාළ විද්‍යඥයින් තම පර්යේෂණ මාලාවේ ඒලඝ අදියරෙහි ප්‍රතිඵලද ලබා ගත්තාට පසුවය. ඒ අනුව කලින් ලිපියෙහි අඩංගු සමහර කරුණු යල් පැනගිය ඒවා වීමටද ඉඩ තිබේ.

විද්‍යාත්මක ලිපි අඩංගු සහරාවන්ගේ මිල පමණට වඩා අධිකවීම තවත් දුර්වලතාවයක් වෙයි. සාමාන්‍යයෙන් එක් විෂයය ක්ෂේත්‍රයකට පමණක් සීමාවූ පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කරන සහරාවන්හි දයකත්වය ලබා ගන්නේ සීමිත පිරියක් විසිනි. ඒ බොහෝ විට විශ්ව විද්‍යාලයන්හි පුස්තකාලයන් වන අතර සමහර සහරාවන්හි දයකයන්ගේ ගණන දෙතුන් සියයකට නොවැඩිය. මේ හේතූන් නිසා පර්යේෂණ සහරාවන් බොහොමයක මිල වාර්ෂිකව ඉහළ නගින අතර, ඊට සමානුපාතිකව දයකත්වය ද සිඝ්‍රයෙන් අඩු වෙමින් පවති. සමහර විද්‍යාත්මක සහරාවන් සඳහා ගෙවිය යුතු වාර්ෂික දයක මුදල "ෆෝ(ර්)ඩ් එස්කෝ(ර්)ට්" (Ford Excort) මෝටර් රථයක මිලට වඩා වැඩිවී ඇතැයි කියැවේ.

පරිගණක තාක්ෂණයේ උදව්වෙන් අලුත් විකල්පයක් සොයා ගැනීමට විද්‍යඥයින් ඉදිරිපත් වී ඇත්තේ මේ නිසාය. තම විද්‍යාගාරයේ පිහිටි "ඉන්ටර්නෙට්" (Internet) සන්නිවේදන ජාලයට සම්බන්ධ කොට ඇති කොම්පියුටරය හරහා පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමට දැන් ඔවුහු ඉදිරිපත්වී සිටිති. මේ නිසා සම්ප්‍රදායික විද්‍යාත්මක සහරා ප්‍රකාශකයන්ගේ අවශ්‍යතාවය හීන වෙමින් පවත්නා අතර, විද්‍යාත්මක සන්නිවේදනයට වඩා සජීවී ස්වරූපයක් ආරූඪ වෙමින් පවති. එනම් පර්යේෂණ ලිපියක් පරිඝණක තිරය මත දිස්වෙනවාත් සමගම, ලෝ පුරා විසිරී සිටින අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයනට ඒ පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීමේ අවස්ථාව උදවේ. එම නිසා පර්යේෂණ ප්‍රතිඵල ඇගයීම සඳහා ඒ වෙනුවෙන්ම තෝරාගත් විශේෂඥයිනට යොමු කිරීමක් අවශ්‍ය වන්නේද නැත. වෙනකක් තබා ලෝකයේ කවර ස්ථානයක විද්‍යාගාරයක පර්යේෂණයක් සිදු වෙද්දී, ඒ මොහොතේම එය දැක බලා ගැනීමේ අවස්ථාව ලඟදීම උදවනු ඇතැයි අනාවැකි පළ කෙරේ. මේ අන්දමට විද්‍යා පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කරන (නැතහොත් බෙදා හරිනු ලබන) ඉලෙක්ට්‍රොනික (නැතහොත් කොම්පියුටර්) විද්‍යාත්මක සහරා 440 ක් පමණ මේ වන විට බිහිවී ඇත. එය 1991 දී පැවති සහරා 110 ක ප්‍රමාණය හා සසඳන විට සිවි ගුණයක වැඩිවීමකි.

සහරා, පොත් පත් ගබඩා කරනු ලබන ස්ථානය හැටියට පුස්තකාලයද මේ හේතුවෙන් පුළුල් පරිවර්තනයකට ලක්වීමට නියමිතව ඇත. ඉහතකී ඉලෙක්ට්‍රොනික විද්‍යාත්මක ප්‍රකාශනයකන් අඩංගු කොම්පියුටර් වල වාසස්ථානය වීමට බොහෝ දුරට ඉඩ ඇත්තේ පුස්තකාලය නොව විද්‍යාගාරයයි. මීට අමතරව පුස්තකාල සේවකයන්ගේ රාජකාරියෙහි පුළුල් වෙනයක් වීමටද නියමිතය. සන්නිවේදන ලෝකයේ විධිමත් බව හා ක්‍රමවත් බව රැකගැනීමේ වගකීම මැනක් වන තුරුම පැවරී තිබුණේ පොත්-පත් සහරා ප්‍රකාශකයන්ට හා පුස්තකාල කාර්යය මණ්ඩලයටය. එහෙත් පරිඝණක සන්නිවේදන ජාලය තුළ එම කාර්යය පැවරී ඇත්තේ පරිඝණක විද්‍යඥයන්ටය. එහෙත් පරිඝණක අන්තර් ජාලය ("ඉන්ටර්නෙට්") ඉදිරිපත් කරනු ලබන තොරතුරු තන්දරාවෙන් ඔබට අවශ්‍ය දෑ තෝරා බේරා ගැනීමේදී පුස්තකාලයාධිපතිගේ ආධාරය අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා තොරතුරු තාක්ෂණයේ නවතම ජයග්‍රහණයන් පිළිබඳ මනා වැටහීමක් හා දැනුමක් සම්ප්‍රදායික පුස්තකාලයාධිපති වෙත ලබා දිය යුතුය. දැනට ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික විද්‍යා පදනම විසින් දියත් කොට ඇති ව්‍යාපෘතියක් මගින් පුස්තකාල සේවකයා, පරිඝණක විශේෂඥයා හා පර්යේෂකයා අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම පිළිබඳව පර්යේෂණ කෙරෙමින් පවති.

ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ ආධිපත්‍යයය ව්‍යාප්ත වීමේ වේගය පිළිබඳව කොතෙකුත් අනාවැකි පළ කෙරුණද මුද්‍රිත මාධ්‍යය මානව වර්ගයාගෙන් සමු ගැනීමේ කාලය තවම උදව් නැතැයි සමහරක් විචාරකයන්ගේ පිළිගැනීම වෙයි. දැනට මානව ශිෂ්ඨාචාරය යතුව ඇති මුද්‍රිත පොත්පත්-සහරා මෙන්ම ඒවා ගබඩා කොට ඇති පුස්තකාල ගොඩනැගිලිද හුදෙක් ද්‍රව්‍යමය වටිනාකමට පමණක් සීමාවූ ඒවා නොවන අතර, ඓතිහාසික හා සංස්කෘතිකමය අගයකින් යුක්ත වන්නේය. ඒ නිසාම පරිඝණක හා තොරතුරු තාක්ෂණය කොතෙක් ජයකෙහෙලි නැංවුවද සම්ප්‍රදායික පුස්තකාල රැක ගැනීම කාගේත් යුතුකම වන්නේය.

VIDUS 18-1/2-25

කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානයෙහි කාර්යභාරය

තාලිනී ද සිල්වා
අධ්‍යක්ෂිකා,
කාර්මික සහ තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ඕනෑම රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි කෘෂිකාර්මික සහ කාර්මික සංවර්ධනය විශේෂයෙන් බලපා ඇත.ඒට අමතරව එවැනි සංවර්ධනයක් සඳහා අවශ්‍ය තොරතුරු නැතහොත් දැනුම් හිමි රටවල් සීඝ්‍ර දියුණුවක් කරා ඵළඹී ඇත. මෙහිදී කාර්මික සහ තාක්ෂණික තොරතුරු. ප්‍රමුඛස්ථානයක් ගෙන ඇත.

ශ්‍රී ලංකාවේද ඉහතකී කාර්මික හා තාක්ෂණික තොරතුරු ලබා දෙන රජයේ හා රජයේ නොවන ආයතන රැසක්වේ. උදහරණයක් ලෙස ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERD) කටුබැද්ද විශ්ව විද්‍යාලය. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය (SLSI) දැක්විය හැක. මෙම කාර්මික හා තාක්ෂණික තොරතුරු ආයතනයන්හි කාර්යභාරය පිළිබඳව කර්මාන්තකරුවන්. විද්වතුන්. ව්‍යවසායකයින්. පර්යේෂකයින් හා පාසල් සිසුන්ද දැනුවත්වීම වැදගත්වේ.

1989 දී කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය (CITIS) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ස්ථාපනයවී ඇත. 1969 දී කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නංවාලීම සඳහා පිහිටුවන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයකි.

මෙම කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය අංශ කිහිපයකින් සමන්විත වේ. එනම් පුස්තකාලය. පරිගණක අංශය. තොරතුරු සේවා අංශය. ප්‍රචාරක හා ප්‍රකාශන අංශයයි.

සම්පත් හා සේවා

කාර්මික හා තාක්ෂණික ක්ෂෙත්‍රයට අදලවූ පොත්පත්. වාරසඟරා. ව්‍යාපෘති වාර්තා 15,000 ක් පමණ පුස්තකාලයේ ඇත. ඒට අමතරව මුද්‍රිත නොවන මාධ්‍ය එනම්. වීඩියෝ පට

40 ක් ද. CD - ROM 06 ක් සුසඳම දර්ශක 834 කින් ද සමන්විතය. මෙම පුස්තකාල සම්පත් පොදු විමර්ශනය සඳහා පහසුකම් ලබාදී ඇති අතර. දළ වශයෙන් දිනකට පාඨකයෝ 100 ක් පමණ පැමිණෙති. මෙම පුස්තකාල සම්පත් වර්ධනයේ දී කෘෂි ආශ්‍රිත කර්මාන්ත. රසායනික කර්මාන්ත. සැලසුම්. සගන්ධ තෙල් ආහාර නිෂ්පාදන කර්මාන්ත බලශක්තිය. රබර් හා ප්ලාස්ටික්. පල්ප සහ කඩදාසි. රෙදිපිළි. දැව හා දැව නිෂ්පාදන. ඉදිකිරීම්. සම්. අලෙවිය. කළමනාකරණ. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව. විදුලි ඉංජිනේරු විද්‍යාව. ඇසුරුම් කර්මාන්ත සහ උපකරණ යනාදී විෂයයන් සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ.

මේ හැරුණු විට ඉහත සම්පත් හා බාහිර තොරතුරු මූලාශ්‍ර ආශ්‍රයෙන් ගොඩනගා ගන්නා ලද පරිගණක ගතකරන ලද තොරතුරු හා දත්ත සමුදයක් වේ. දැනට මෙම දත්ත යන්ත්‍රෝපකරණ. කර්මාන්ත. පුස්තකාල සම්පත් පිළිබඳව ග්‍රන්ථ විඥාපන තොරතුරු හා කර්මාන්ත සංවර්ධන ආයතන යනාදී තොරතුරු ආවරණය කෙරේ. පරිගණක අංශය විසින් මෙම දත්ත සමුදය යාවත්කාලීනව පවත්වා ගෙන යාමේ කටයුතු කරනු ලබන අතර. කාර්මික සංවර්ධන මණ්ඩලයේ සෙසු අංශ සඳහා අවශ්‍ය පරිගණක පත්‍රම (programmes) සකස් කිරීමේ කාර්යෙහිද නිරතවනු ලැබේ.

මෙම මධ්‍යස්ථාන ලේසර් මුද්‍රණ යන්ත්‍රයක්. ජායා පිටපත් යන්ත්‍රයක්. සුසඳම දර්ශක කියවන උපකරණයක්. තුඩා 313 ඕෆ්සෙට් යන්ත්‍රයක් සහ Digital duplicating යන්ත්‍රයක්. වීඩියෝ යන්ත්‍රයක්. ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටරයක් යනාදී උපකරණ සහ පරිගණක පහසුකම් වලින්ද සමන්විත වේ.

මේ හැරුණුවිට මෙම කාර්මික තාක්ෂණවේදී තොරතුරු සේවා මධ්‍යස්ථානයේ සේවයට කැපවූ කාර්ය මණ්ඩලයකින්ද යුක්ත වේ.

සේවා

කාර්මික හා තාක්ෂණවේදී තොරතුරු සේවා මධ්‍යස්ථානයේ පුස්තකාලයේ ඇති සම්පත් ශ්‍රී ලංකාවේ එම ක්ෂේත්‍රයේ පවත්නා අග්‍රගණ්‍යයේ එකතුවකි. මෙය විමර්ශනය සඳහා තොමිලේ පහසුකම් සලසා ඇති අතර. ජායා පිටපත් සහ පරිගණක පිටපත් ලබා ගැනීමේ පහසුවද සලසා ඇත. සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.45 දක්වා පමණක් විවෘතව ඇත. සාමාන්‍ය විමර්ශන සේවාවට අමතරව රු. 100/- ක වාර්ෂික සාමාජිකත්වය ලබා ගැනීමෙන් තොකඩවා ඔබේ නිවසට තොරතුරු සැපයීමේ සේවාවක්ද වේ. (IIS membership) කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට හැර මෙහි පොත්පත්. වාරසඟරා බැහැර ගෙන යාමට පහසුකම් නොවුවද ආයතනික සාමාජිකත්වය ලබා අන්තර් පුස්තකාල භුවමාරු සේවාව යටතේ අවශ්‍ය ආයතනවලට නිකුත් කිරීමද සිදු කෙරේ. කාර්මික තොරතුරු සැපයීම හා විස්තාරණය සේවා විවිධාකාරයට සිදු කෙරේ. පිළිතුරු සේවාව. ප්‍රකාශන හා අත් පත්‍රිකා අලෙවිය. ප්‍රදර්ශන කටයුතු ආදී සේවාවන් මෙම මධ්‍යස්ථානයන් විසින් පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රශ්න හා පිළිතුරු සේවය යටතේ ඉහත දැක්වූ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදලව ඔබට අවශ්‍ය කරුණු පෞද්ගලිකව. ලිඛිතව දුරකථන පනිවිඩ මාර්ගයෙන් හෝ fපැක්ස් මඟින් විමසීමටත් ඒ අනුව පිළිතුරු සැපයීමත් වේ. මෙම පිළිතුරු අප සතු සම්පත් ආශ්‍රයෙන් ලබා දෙනු ලැබේ. මේ සඳහා විමසීම් අනුව සුළු අයකිරීමක් කරනු ලැබේ. තවද. පුස්තකාලයට අයත් කරගනු ලබන නවතම පොත්පත් හා වැදගත් ලිපි. ලිපි අනුක්‍රමණිකාවක් "නවතම දැනුම සේවය" යනුවෙන් පුස්තකාල සාමාජිකයින් වෙත ලබා දෙනු ලැබේ. එසේම කිසියම් කර්මාන්තයක් අළලා පාඨකයින්ට අවශ්‍ය පරිදි තොරතුරු ගොනුවක් සැපයීමටත් ඒ සඳහා මුදලක් අය කිරීමටත් කටයුතු යොද ඇත. මෙම තොරතුරු ගොනුව තාක්ෂණික ක්‍රියාවලිය. අමුද්‍රව්‍ය. වෙළඳපොළ. යන්ත්‍රසූත්‍ර හා ඒවා සපයන ආයතන ආදී තොරතුරු අඩංගු වුවකි.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන තාක්ෂණික වැඩමුළු අළලා සම්පාදිත අත්පොත් මුද්‍රණය කිරීම හා අලෙවියද මෙම අංශයෙන් සිදු කෙරේ. මෙයට අමතරව කර්මාන්ත පුවත් හා කර්මාන්ත සහරාව සම්පාදනය හා බෙද හැරීමද සිදු කෙරේ. එසේම විවිධ කර්මාන්ත අළලා සැකසුනු අත් පත්‍රිකා සම්පාදය හා අලෙවියද විවිධ පලාත්වාසීන් සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවා අළලා ප්‍රදර්ශන සංවිධාන හා වෙනත් ප්‍රචාරාත්මක වැඩසටහන් සංවිධානය කිරීමද කරනු ලැබේ.

දැනට කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය දේශීය තොරතුරු ජාල එනම් තරේසා ආයතනය (SLISTINET) හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ APPINESS ජාල හා සම්බන්ධ වී ඇති අතර. TECHINET තොරතුරු ජාලයේ මව් ආයතනය වශයෙන් ශ්‍රී ලංකාවේ කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා සම්බන්ධීකරණය කිරීමේ වගකීමද පැවරී ඇත.

කාර්මික තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය INTERNET නැමති අන්තර් ජාතික තොරතුරු ජාල පද්ධතියට පිවිසීමටත් E-mail සේවය ලබා ගැනීමට අවශ්‍ය අඩිතාලම දැනටම යොද ඇත. මෙයින් වඩාත් පුළුල් සේවයක් කාර්මිකයන්ට හා ව්‍යවසායකයින්ට ලබා දීමත්. ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනයට අවශ්‍ය සහාය ලබාදීම අපගේ අධිෂ්ඨානය වේ.

VIDUS 18-1/25 27

සැමට තොරතුරු බෙදන

ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය

අමල් උඩවත්ත

දේශීය විද්‍යාඥයින්ගේත්, විවිධ විද්‍යා හා තාක්ෂණික විෂයයන් පිළිබඳව පර්යේෂණ කරන පර්යේෂකයන්ගේත්, උන්නතිය උදෙසා මහඟු සේවාවක් ඉටු කරන ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය (තරේසා) විසින් විද්‍යා හා තාක්ෂණික තොරතුරු බෙදා හැරීම සඳහා පිහිටුවා තිබෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය මගින් කෙරෙන්නාවූ සේවාවන් රාශියකි. මෙම සේවාවන් පිළිබඳව විමසීමට මා ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා දීපාලි තලගල මහත්මිය හමුවුනා.

ප්‍රශ්නය : **විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය පිළිබඳව හැඳින්වීමක් හා එහි අරමුණු පිළිබඳව කිසියම් විස්තරයක් කරන්න.**

තරේසා ආයතනයේ, විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා, දීපාලි තලගල මහත්මිය සමඟ කළ සාකච්ඡාවක් ඇසුරිනි.

පිළිතුර : මෙම විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය ඉංග්‍රීසියෙන් හඳුන්වන්නේ Sri Lanks Scientific and Technical Information Centre හෙවත් SLSTIC යනුවෙනුයි. මෙය ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය තුළ පිහිටා තිබෙනවා. මෙම මධ්‍යස්ථානය පිහිටුවීමට ප්‍රධානවූ අරමුණ ලෙස විද්‍යාවට හා තාක්ෂණයට අදාළ තොරතුරු එක්රැස් කිරීමත්, එසේ එක්රැස් කරගත් තොරතුරු සැකසීමත්, සකසාගත් තොරතුරු ප්‍රචාරණය කිරීමත් පෙන්වා දෙන්න පුළුවන්.

මෙම අරමුණු ඉටුකිරීම සඳහා ලංකාවේ විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ විසිරී ඇති සම්පත්, සෑම දෙනාටම පරිහරණය කිරීමට හැකිවන ලෙසට පුස්තකාල ජාලයක් පිහිටුවා තිබෙනවා. අපේ රටේ තිබෙන බොහෝ පුස්තකාලවලත්, තොරතුරු මධ්‍යස්ථානවලත්, තිබෙන්නේ පොත්පත්, සඟරා හා ලිපි ලේඛන එකතුවක් පමණයි. අප තොරතුරු

මධ්‍යස්ථානයේ අරමුණ පොත්පත්. සඟරා එක්රැස් කිරීමම පමණක් නොවේ. වෙනත් පුස්තකාලවල ඇති සම්පත් පිළිබඳ තොරතුරු එක්රැස් කර අවශ්‍යතාවන් අනුව ඒවාට යොමු කිරීම මෙමගින් කෙරෙන එක් කාර්යයක්.

ප්‍රශ්නය : මෙම විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය මගින් විද්‍යා තොරතුරු ගවේෂණයේ යෙදෙන පිරිස් වෙතට සලසන සෙත කුමක්ද?

පිළිතුර : මේ සඳහා අප මෙවලම් කිපයක් හදුන්වා දී තිබෙනවා. එයින් එක් මෙවලමක් නම් විද්‍යාත්මක හා තාක්ෂණික සඟරා ඒකාබද්ධ සුවියයි. ශ්‍රී ලංකාව පුරා විහිදී ඇති පුස්තකාල 54 ක ඇති විද්‍යා හා තාක්ෂණික සඟරා 6000 ක් පමණ මේ විද්‍යා හා තාක්ෂණික සුවියට ඇතුලත්වී තිබෙනවා.

දෙවැන්න ශ්‍රී ලංකාවේ විද්‍යා අනුක්‍රමණිකාවයි. ශ්‍රී ලංකාවේ පලකර ඇති සියලුම. ලිපි වාර්තා ආදිය මෙහි ඇතුලත් වෙනවා. මේවායේ ග්‍රන්ථ විඥාපන තොරතුරු සමග සාර සංග්‍රහයක්ද. ඇතුලත් කිරීමෙන් විද්‍යාඥයින්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට පහසුවී තිබෙනවා. මෙම මෙවලම් දෙකම දැනට පරිගණක දත්ත සමුදයන් ලෙස පවත්වා ගෙන යනු ලබනවා.

ප්‍රශ්නය : අප දන්නවා විද්‍යා හා තාක්ෂණික තොරතුරු ජාලය යනුවෙන් හදුන්වන තොරතුරු ඛෙද හැරීමේ ජාලයක් පිහිටුවා තිබෙන බව. මෙම ජාලය මගින් සලසන සේවාවන් මොනවාද?

පිළිතුර : ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණික තොරතුරු ජාලය පිහිටුවා තිබෙන්නේ ශ්‍රී ලංකා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය කේන්ද්‍රීයව වෙනත් විද්‍යා හා තාක්ෂණික පුස්තකාලවල සහාය ඇතිවයි. මේ ජාලය තියා තොරතුරු මධ්‍යස්ථානයටත් වෙනත් පුස්තකාලවලටත් වටිනා තොරතුරු රැසක් හා අනෙකුත් සම්පත් රැසක්ද නුවමාරු කරගැනීමට හැකි වෙලා තිබෙනවා. ඒ වගේම මේ ජාලය සමග දැනට ලංකාවේ පුස්තකාල 108 ක් පමණ සම්බන්ධවී තිබෙනවා.

ලංකාවේ කිසිම පුස්තකාලයකට තමන්ට අවශ්‍ය සියළු සම්පත් ලබාගැනීමට හැකියාවක් නැහැ. එනියා සැම පුස්තකාලයකට ඇති සම්පත් සැම දෙනා අතරේ බෙදා ගැනීම සඳහා වැඩපිළිවෙලක් මෙමගින් ක්‍රියාත්මක වෙනවා.

අන්තර් පුස්තකාල පොත් බැහැරදීමේ ක්‍රමයද තවත් එකක්. ඒ වගේම වෙනත් ආයතනයක විද්‍යාඥයෙකුට තමන්ට අවශ්‍ය ලිපියක් පිටරටකින් ගෙන්වා ගැනීමේ පහසුකම් ද මෙම ජාලය තුළ ක්‍රියාත්මක වෙනවා.

ලංකාවේ පලවන පර්යේෂණ වාර්තා, සම්මන්ත්‍රණ තොරතුරු, සම්මේලන වලින් ලැබුණු ලිපි ලේඛන හා ඒවායේ තොරතුරු තැන්පතුවක් ලෙස පවත්වා ගෙන යාමට උත්සාහ ගත්තවා.

ප්‍රශ්නය : අනෙකුත් පුස්තකාලවලට ඔබගේ තොරතුරු මධ්‍යස්ථාන යෙන් සලසන සේවාවන් මොනවාද?

පිළිතුර : සම්පත් අඩු පුස්තකාලවලට අවශ්‍ය ලිපිවල ඡායාරූප පිටපත් සහන මිලකට ලබා දෙනවා. යම් ලිපියක පිටපතක් පිටරටකින් ලබා ගැනීමට අවශ්‍ය නම් එම පිටපත් ලබාදීමට කටයුතු කිරීමත්. ඒ සඳහා වැයවන මුදල් දේශීය මුදල් වලින් ගෙවීමට සැලැස්වීමත් තොරතුරු මධ්‍යස්ථානයේ එක් ප්‍රධාන කටයුත්තක්.

විද්‍යාඥයින්ට යම් පොත්පත් පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා දෙනවා. එනම් එම අවශ්‍ය පොත් සඟරා ඇත්තේ කුමන පුස්තකාලයේද ඒවා ලබාගත හැක්කේ කවර

අයුරකින්ද යන විස්තර ලබාදීමට කටයුතු කරනවා. එවන් අවස්ථාවකදී තමන් සාමාජිකත්වය දරන පුස්තකාලය මගින් ඉල්ලීමක් කළ යුතුයි.

ප්‍රශ්නය : මේ විද්‍යාත්මක හා තාක්ෂණික පුස්තකාල - යෙන් තොරතුරු ලබා දීමට අමතරව කෙරෙන වෙනත් වැදගත් කාර්යයන් මොනවාද?

පිළිතුර : තොරතුරු ලබාගන්නා ආකාරය පිළිබඳව පාඨකයින්ට පුහුණුවක් ලබා දීමට වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරනවා. ඒ හැරුණුකොට පුස්තකාල සේවයේ නිරත පුද්ගලයින් සඳහාත්, විශේෂයෙන් සැලසුම් කළ වැඩසටහන් පවත්වනවා. එනම් පුස්තකාල පරිගණකකරණය සඳහා භාවිතා කරන CDS/ISIS නම් මෘදුකාංගය ශ්‍රී ලංකාවේ බෙදහැරීමේ බලය පැවරී ඇත්තේ මේ මධ්‍යස්ථානයටයි. මෙම මෘදුකාංගය භාවිතා කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීම වැනි කාර්යයන්ද කෙරෙනවා.

ප්‍රශ්නය : නවීන තොරතුරු තාක්ෂණය ඔබ ආයතනයේ කොතෙක් දුරට පරිහරණය කරනවාද?

පිළිතුර : දැනට නරේසාහි ස්ල්ස්ටික් මධ්‍යස්ථානය තුළ පරිගණක ජාලයක් ක්‍රියාත්මක වෙනවා. මේ ජාලයට පරිගණක 15 ක් ද සංගෘහිත තැටි යන්ත්‍ර 10 ක්ද ඇතුලත් වෙනවා. එමෙන්ම ලෝකයේ බොහෝ සෙයින් කතාබහට ලක්වී තිබෙන අන්තර්ජාතික පරිගණක ජාලයට (Inter net) පූර්ණ වශයෙන් සම්බන්ධවී තිබෙනවා.

ප්‍රශ්නය : තොරතුරු හුවමාරුව සඳහා අන්තර්ජාතික ජාලයන්, සංගෘහිත තැටීන් ඔබ උපයෝගී කරගන්නේ කෙසේද?

පිළිතුර : දැනට අප ආයතනය පිළිබඳ හෝම් පේජ් (Home page) එකක් සකසා තිබෙනවා. මෙය තුළින් අප ආයතනය පිළිබඳව පමණක් නොව ලංකාවේ අනෙකුත් විද්‍යා හා තාක්ෂණ ආයතන පිළිබඳ තොරතුරු මුළු ලොවට ප්‍රචාරය කරනවා. මෙමගින් අපේ රටේ විද්‍යා හා තාක්ෂණ තොරතුරු බෙදා හැරීමද අපේ අරමුණයි.

සංගෘහිත තැටිවල අඩංගු දත්ත සමුදය මගින් අපේ රටේ විද්‍යාඥයින්ට අවශ්‍යය තොරතුරු සැපයීම කෙරෙනවා. දැනට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සංගෘහිත තැටි 05 ක් අප ලබාගෙන සිටිනවා.

ප්‍රශ්නය : නරේසා ආයතනය මේ අන්තර්. ජාලයට (Inter net) සම්බන්ධ වූයේ කෙසේද?

පිළිතුර : ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සිටින විද්වතුන් අතර සන්නිවේදනය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුග්‍රහය ඇතිව "ශ්‍රී ලංකා අධ්‍යාපනික විද්වත් සහ පර්යේෂණ ජාලය" (LEARW) නමින් පරිගණක ජාලයක් පිහිටුවා තිබෙනවා. මෙම ජාලයට නරේසා ආයතනයත් සම්බන්ධ වී සිටිනවා. අන්තර් ජාලය හා සම්බන්ධතාව අපට ලබාදී ඇත්තේද මෙම ජාලයයි.

ප්‍රශ්නය : ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්,බලශක්ති හා විද්‍යා අධිකාරිය සතු විද්‍යා ප්‍රකාශන පිළිබඳ යම් විස්තරයක් කරන්න.

පිළිතුර : ශ්‍රී ලංකාවේ විද්වතුන් සඳහාත් පාසල් ළමුන් සඳහාත් නරේසා ආයතනය මගින් පලකරන ප්‍රකාශන රාශියක් තිබෙනවා. මේ අතර මාස තුනකට වරක් පල කෙරෙන ජාතික විද්‍යා සභරාව (JNSC), "විදුරාව" සහ "සමාජ විද්‍යා සභරාව" ද ප්‍රධාන තැනක් ගන්නවා. ඒ වගේම වරින්වර පල කෙරෙන නොයෙකුත් ග්‍රන්ථ තිබෙනවා. "විද්‍යා අධ්‍යාපන පොත් පෙළ" සහ "විද්‍යා ගවේෂණ පොත් පෙළ" සහ "මිනිසා සහ පෙව ගෝලය" යන පොත් පෙළද වැදගත් ප්‍රකාශන ලෙස හැඳින්විය හැකියි.

ප්‍රශ්නය : **දේශීය වශයෙන් හැරුණුකොට ජාත්‍යන්තර වශයෙන් මෙම තොරතුරු මධ්‍යස්ථානය මගින් කෙරෙන කටයුතු මොනවාද?**

පිළිතුර : අප ආයතනය අන්තර් ජාතික ආයතනයන්හි සාමාජිකත්වය ලබා සිටිනවා. මෙම ආයතන පිළිබඳව ලැබෙන තොරතුරු ලංකාවේ අනෙකුත් ආයතන අතර බෙදහැරීම අප විසින් සිදුකරනවා. පහත දැක්වෙන්නේ අප සම්බන්ධව සිටින ආයතනවල නම් පෙළයි.

* Association for Science Cooperation in Asia (ASCA)
* Association of Asian Social Science Research Councils (AASSREC)
* Committee for S & T in Developing Countries (COSTED)
* Commonwealth Science Council (CSC)
* International Centre for Genetic Engineering & Biotechnology (ICGEB)
* International Council of Scientific Unions (ICSU)
* South Asian Association for Regional Co-oeration (Sub nodal point for the Technical Committee on S & T) (SAARC)
* Swedish International Development Co-operation Agency (SIDA)
* Third World Academy of Sciences (TWAS)
* Regional Network for the Exchange of Information and Experience in Science and Techonolgy in Asia and the Pacific (ASTINFO)





තරේසා ආයතනයේ පුස්තකාලයේ අන්තර් ජාලය තුලින් කෙරෙන තොරතුරු සෙවීමක්

ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණික තොරතුරු
මධ්‍යස්ථානයේ
අන්තර්ජාල සහ සංගෘහිත තැටි
පහසුකම් සහිත

* පුද්ගල සාමාජිකත්වය
හා
* ආයතනික සාමාජිකත්වය
සඳහා

විමසීම් : අධ්‍යක්ෂ / තොරතුරු හා විද්‍යාත්මක නිලධාරී / ජාල පරිපාලක
ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය,
47/5, මේවිලන්ඩ් පෙදෙස, කොළඹ 7.
ටෙලි : 696771-3, E, Mail : Library@naresa.ac.lk ෆැක්ස් : 691691



කොළඹ මහජන පුස්තකාලය



අවශ්‍ය පොතපත තෝරා ගැනීම නිදහසේ කළ යුත්තකි